# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,162 — 1962 ජූනි 8 වැනි සිකුරාද — 1962.6.8

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඝ කරන ලදි)


## I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය ... | 883 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 883 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය | 884 |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 885 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... — — | 886 |
| මිළ පාලන දැන්වීම් ... ... — | — |
| ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... — | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... — | 893 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... — | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 221

අංකය: ඞී. 23/රෙක්ට/123.

### යුද්ධ හමුදාව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ඉල්ලා අස්වීමක්

1962 ජූනි මස 1 වැනි දින සිට ඉල්ලා අස්වීම

තාවකාලික කපිතන් මවොර්නීන් මයිකල් ගෝර්ඩන් පෝල්, ලං. ස. ස. බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කිව්. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 මැයි 26 වෙනිදා,
කොළඹ දීය.

6-451

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 222

ඒ. 76/62.

1962 මැයි මස 2 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක සී. ඞී. විජේදේවේන්ද්‍රන් මහතා ස්වකීය රාජකාරිවලට අතිරේකව එම දෙපාර්තමේන්තුවේ ගෘහ කර්මාන්ත පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස වැඩ බැලීමට.

ඒ. 55/62.

1962 පෙබරවාරි මස 24 වැනි දින සිට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරුකරු ඊ. අයි. ද ඇස්. ගුණසේකර මහතා ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු ලෙස වැඩ බැලීමට.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර තක්සේරුකරුවන් වන ඇම්. ඇස්. ඇම්. ඊ. සමරතුංග සහ ඒ. සී. ඇස්. පෙරේරා යන මහතුන් පිළිවෙලින් 1962 පෙබරවාරි මස 15 සහ 1962 පෙබරවාරි මස 24 වැනි දිනයන්හි සිට තක්සේරුකරුවන් ලෙස රාජකාර්යයන්හි යෙදීමට.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරුකරු කේ. රත්න සබාපති මහතා 1961 නොවැම්බර් මස 4 වන දින සිට එම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු ලෙස වැඩ බැලීමටත් 1961 නොවැම්බර් මස 6 වන දින සිට ජ්‍යෙෂ්ඨ තක්සේකරුවකු ලෙසත්,

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරුකරු ඒ. ජී. ජේග සෝති මහතා 1961 නොවැම්බර් මස 6 වන දින සිට එම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු ලෙස වැඩ බැලීමටත් 1962 ජනවාරි මස 1 වන දින සිට ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු ලෙසත්,

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරුකරු ඊ. එම්. ජී. තිලකරත්න මහතා 1962 ජනවාරි මස 1 වන දින සිට එම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු ලෙස වැඩ බැලීමට.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර තක්සේරුකරු එස්. ජී. අළුවිහාරේ මෙනෙවිය 1961 නොවැම්බර් මස 4 වන දින සිට තක්සේරුකරුවෙකු ලෙස රාජකාරියන්හි යෙදීමට.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර තක්සේරුකරු එම්. එස්. එම්. ඊ. සමරතුංග මහතා 1961 නොවැම්බර් මස 6 වන දින සිට එම දෙපාර්තමේන්තුවේ තක්සේරුකරුවෙකු ලෙස රාජකාරියන්හි යෙදීමට.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර තක්සේරුකරු ඒ. සී. එස්. පෙරේරා මහතා 1961 නොවැම්බර් මස 6 වන දින සිට එම දෙපාර්තමේන්තුවේ තක්සේරුකරුවෙකු ලෙස රාජකාරියන්හි යෙදීමට.

සී. ජ. වල්පිට,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 ජූනි මස 4 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500,

6-496

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 223

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඑම්. 7/53.

ඩී. ඩබ්ලිව්. කේ. ලද්දුවහෙට්ටි මහතා 1962 අප්‍රේල් 20 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, ලංකා අධිකරණ සේවයේ නිලධාරියකු වශයෙන්.

අංකය : ජේඑම්. 7/53.

ඩී. එස්. නෙත්සිංහ මහතා 1962 මැයි 1 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, ලංකා අධිකරණ සේවයේ නිලධාරියකු වශයෙන්.

අංකය : ජේඑල්. 26/50.

ඒ. ඩී. ජේ. ගුණවර්ධන සහ එස්. ඩී. ජයසුන්දර යන මහතුන් නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. වී. බස්නායක මහතා 1962 මැයි 26 වැනි දින, ගම්පහ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා ගම්පහ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 3බී/60.

එස්. අමරසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 මැයි 24 වැනි දින කොළඹ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ, අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑඒ. 8/48.

එස්. එස්. ආරියරත්නම් මහතා 1962 ජූනි 9 වැනි දින සිට, මඩකලපුවේ මහේස්ත්‍රාත් උසාවියේ අංක 8591 දරණ නඩුව ඇසීමට හා තීන්දුව දීමට, මඩකලපුවේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා මඩකලපුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 65ඒ/61.

ජේ. බී. සී. සුවාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එල්. එස්. වී. පෙරේරා මහතා 1962 ජූනි 11 වැනි දින සිට 16 වැනි දින දක්වා, බදුල්ල-හල්දුම්මුල්ල, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා බදුල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 16ඒ/59.

ඩී. ජී. ධර්මසේකර සහ එල්. සමරතුංග යන මහතුන් නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. පී. ද සිල්වා මහතා 1962 මැයි 26 වැනි දින, බලපිටියේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා බලපිටියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 13ඒ/59.

පී. ඩී. ජී. ද අල්විස් මහතා නැති අතර හා නැවත වැඩ බාර ගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා 1962 මැයි 26 වැනි දිනද හා 30 වැනි දින සිට, මාතර, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මාතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 9ඒ/52.

ජී. ඕ. එෆ්ජ්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ද සිල්වා මහතා 1962 මැයි 23 වැනි දින, කළුතර, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කළුතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 9ඒ/52 (ඒ).

ජී. ඕ. එෆ්ජ්. ද සිල්වා මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. ද ආබෲ මහතා 1962 මැයි 24 වැනි දින සිට, කළුතර, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා කළුතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 2ඒ/54.

ඩී. එස්. එල්. පී. අබේසේකර මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. ආර්. ද අල්විස් මහතා 1962 මැයි 25 වැනි හා 26 වැනි දිනයන්හි, කොළඹ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට, හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ, අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට, දෙහිවල-ගල්කිස්ස, අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට, හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 29සී/61.

එම්. ජමීල් මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 ජූනි 9 වැනි දින සිට, කොළඹ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 52ඒ/60.

බී. එස්. සී. රත්වත්තේ සහ මොහමඩ් හුසේන් යන මහතුන් නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. එම්. කුලතිලක මහතා 1962 මැයි 26 වැනි හා 27 වැනි දිනයන්හි, ගාල්ලේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, ගාල්ලේ, අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට, හා ගාල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 68සී/51.

සී. වී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. ජයවික්‍රම මහතා 1962 ජූනි 2 වැනි හා 3 වැනි දිනයන්හි, අනුරාධපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට, ත්‍රිකුණාමලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ත්‍රිකුණාමලේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 57ඒ/57.

කේ. ඩී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එම්. අයි. ගුණරත්න මහතා 1962 මැයි 25 වැනි දින සිට 28 වැනි දින දක්වා හා 31 වැනි දින සිට 1962 ජූනි 4 වැනි දින දක්වා, ගම්පොල පිහිටි උසාවියේ ක්‍රියා කරණ පිණිස, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා ගම්පොල, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 58බී/59.

එස්. සෙල්ලයියා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. ඒ. එල්. කොරෙයා මහතා 1962 මැයි 25 වැනි දින, හලාවත, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හලාවත, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, පුත්තලමේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා පුත්තලමේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 12ඒ/57.

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එම්. ඒ. වික්‍රමසූරිය මහතා 1962 මැයි 25 වැනි දින සිට 27 වැනි දින දක්වා, තංගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා හම්බන්තොට, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 66ඒ/54.

සී. තනබාලසිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. මුත්තුකුමාරපිල්ලේ මහතා 1962 මැයි 24 වැනි දින සිට 28 වැනි දින දක්වා, යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා යාපනේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 42සී/54.

ජී. සී. නයිල්ස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා 1962 මැයි 28 වැනි දින සිට 30 වැනි දින දක්වා, මාතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මාතර, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑඒ. 12/48.

ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 ජූනි 16 වැනි දින සිට, කොළඹ මහේස්ත්‍රාත් උසාවියේ අංක 13411/බී දරණ නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, කොළඹ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට, හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 3ඒ/57.

ඒ. එම්. අමීන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ජී. එච්. සුදිරත්න මහතා 1962 ජූනි 2 වැනි දින සිට 4 වැනි දින දක්වා (කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල), කනුදල්ලේ පිහිටි උසාවියේ, කුරුණෑගල, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට (කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල), කනුදල්ලේ පිහිටි උසාවියේ, කුරුණෑගල, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 23ඒ/56.

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී.-ඒ. ඊ. මීගම මහතා 1962 ජූනි 2 වැනි දින සිට 4 වැනි දින දක්වා, පානදුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා පානදුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 27ඒ/61.

බී. එස්. සී. රත්වත්තේ සහ මොහමඩ් හුසේන් යන මහතුන් නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එම්. එම්. තහීර් මහතා 1962 මැයි 31 වැනි දින, ගාල්ලේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට ගාල්ලේ අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට හා ගාල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඒඒ. 43/57

සී. බී. හුනුකුඹුර මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 ජූනි 7 වැනි දින, මිහින්තලේ ගම්බද උසාවියේ අංක 2446 දරණ සිවිල් නඩුව ඇසීමට, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පලාතේ සහ බටහිර නුවරගම් පලාතේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඒඒ. 43/57.

සී. බී. හුනුකුඹුර මහතා නැති අතර, එස්. ඒ. යටවර මහතා 1962 ජූනි 7 වැනි දින, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තමන්කඩුව පලාතේ සහ කලාගම් පලාතේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා දකුණු හුරුළු පලාතේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්./ඩී. 6/52.

ඩී. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඩබ්ලිව්. ජේ. මුත්තුකුමාරු මහතා 1962 ජූනි 1 වැනි හා 2 වැනි දිනයන්හි, පුත්තලම් දිස්ත්‍රික්කයේ, පුත්තලම්පත්තු, දෙමළ හත්පත්තු සහ කල්පිටියේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඒඒ. 5/57.

ඒ. ජේ. සාහිඩ් මහතා 1962 ජූනි 19 වැනි දින, වලගෙදර ගම්බද උසාවියේ අංක 3430 දරණ අපරාධ නඩු ඇසීමට, කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර සහ බස්නාහිර පස්දුන් කෝරල යන්හි සහ කළුතර තොටමුනේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඑල්/එච්. 1/48.

ටී. එල්. ජේ. හඩ්ජි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ඩබ්ලිව්. ඒ. ඉමැනුවෙල් මහතා 1962 ජූනි 1 වැනි, 2 වැනි, 4 වැනි හා 5 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැළඹිලි හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඒඒ. 22/57.

වී. ඒ. ඩබ්ලිව්. වික්‍රමසූරිය මහතා 1962 ජූනි 7 වැනි දින, අම්බලන්තොට ගම්බද උසාවියේ අංක 552 දරණ සිවිල් නඩුව ඇසීමට තංගල්ල දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගිරුවා පත්තුවේ සහ මාගම් පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඑල්/පී. 7/56.

එම්. එම්. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. එච්. අබ්දුල් කාදර් මහතා 1962 මැයි 30 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැළඹිලි හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්./එස්. 6/48.

පී. සෝමසුන්දරම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. වී. සේනාතිරාජා මහතා 1962 මැයි 31 වැනි දින සිට 1962 ජූනි 1 වැනි, 2 වැනි දිනයන්හි හා 4 වැනි දින සිට 6 වැනි දින දක්වා, වවුනියා සහ යාපන දිස්ත්‍රික්කවල උතුරු වවුනියාවේ සහ මුහුදුබඩ පත්තුවල ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා පූනකාරි-තුන්නුකායි ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන් ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 මැයි 31 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය—573,
කොළඹ—12.

6-346

# වෙනත් පත්කිරීම් ආදිය

1962 අංක 224

## දැන්වීමයි

ධම්සේන ද සිල්වා කුරුකුලසූරිය මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුලත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 මැයි මස 31 වැනි දින,
කොළඹදීය.

6-482

1962 අංක 225

## දැන්වීමයි

කුලේන්ද්‍රන් සෙල්වනායගම් මහතා මඩකලපුව අධිකරණ කොට්ඨාශය ඇතුලත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 මැයි මස 31 වැනි දින,
කොළඹදීය.

6-483

1962 අංක 226

අංකය : ඊබී/ඒ—258.

පහත සඳහන් පත්කිරීම් කිරීමට කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා සතුටුවී ඇත:—

බදුල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත එන්. විජේවර්ධන මහතා, නුවරඑළිය පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බලන කාලය තුළ, ස්වකීය රාජකාරිවලට අතිරේකව, 1962 අප්‍රේල් මස 16 වැනි දින සිට, නැවත නියෝගයක් කරන තුරු, නුවරඑළිය පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැට්‍රෝල් ආඥා පනත යටතේ ප්‍රාදේශීය අධිකාරී.

වී. එල්. වීරසිංහ,
ස්ථිර ලේකම්.

1962 මැයි මස 25 වැනි දින,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
කොළඹ 7.

6-204

1962 අංක 227

## 1950 අංක 25 දරණ ආහාර පාලන පනත යටතේ පත් කිරීම

1950 අංක 25 දරණ ආහාර පාලන පනතේ 2 වැනි වගන්තිය යටතේ තිරිමදුර රෙජිනෝල්ඩ් ලේස්ලි ධම්සේන මහතා මුළු දිවයිනේ සහකාර ආහාර පාලකයෙකු වශයෙන් 1961 නොවැම්බර් 1 වෙනි දින සිට පත් කොට තිබෙන බව මින් දන්වමි.

ආර්. එල්. ආර්නෝල්ඩ්,
ආහාර පාලක සහ ආහාර කොමසාරිස්,

1962 මැයි මස 28 දින,
ආහාර කොමසාරිස් කාර්යාලය,
330, යූනියන් පෙදෙස,
කොළඹ-2.

6-300

### සංශෝධනය කිරීමක්

අංක 13,027 හා 1962. 4. 19 වන දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ 1 වැනි කොටසේ 629 වැනි පිටුවේ වෙනත් පත් කිරීම් යටතේ පළවූ අංක ඊබී/ඒ-204 හා 62.4.10 දරණ ගැසට් නිවේදන යෙහි, යාපනය පාලන දිස්ත්‍රික්කය භාර වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත, වී. පි. විට්ටච්චි මහතා, සවකීය රාජකාරිවලට අතිරේකව 1962 අප්‍රේල් මස 2 වැනි දින සිට නැවත නියෝගයක් කරන තුරු, යාපනය පාලන දිස්ත්‍රික්කයේ "සහකාර ජේශ්‍ය අයකැමි" යැයි සඳහන් වී තිබෙන මුත් එය "ජේශ්‍ය අයකැමි" යනුවෙන් නිවැරදි විය යුතුය.

ඇම්. ජේ. පෙරේරා,
සථිර ලේකම් වෙනුවට.

1962 මැයි මස 26 වැනි දින,
කම්කාන්ත, සවදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
කොළඹ 7.

6-352

---

## ආණ්ඩුවේ නිවේදන

අංකය 965/15/128(එස් බී/ඊ)

### 1961 අංකය 19 දරණ නැව් නැගීමේ බදු පනත

#### 2 (1) වගන්තිය යටතේ ආඥව

1961 අංකය 19 දරණ නැව් නැගීමේ බදු පනතේ 2 (1) වගන්තිය යටතේ මුදල් ඇමැති විසින් කරණ ලද ආඥව.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
මුදල් ඇමැති.

1962 මැයි 27 වැනි දා,
කොළඹ දී ය.

#### ආඥව

1961 අංකය 19 දරණ නැව් නැගීමේ බදු පනතේ 2 (1) වගන්තිය යටතේ නැව් නැගීමේ බද්දක් 1962 ජූලි මාසයේ 1 වැනි දවසේ දීත් ඉන් පසුවත් නියම කර අය කළ යුතු යැයි මෙයින් නියෝග කරණු ලැබේ.

6—369/1.

---

එල්. ඩී. බී. 28/61.

අංකය :965/15/128(එස් බී/ඊ)

### 1961 කේ අංකය 19 දරණ නැව් නැගීමේ බදු පනත

1961 කේ අංකය 19 දරණ නැව් නැගීමේ බදු පනතේ II වැනි වගන්තිය යටතේ මුදල් ඇමැතිවරයා විසින් සම්පාදනය කරණ ලදුව එම වගන්තියේ (3) උප වගන්තිය යටතේ සෙනේට් මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරණ ලද රෙගුලාසි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
මුදල් ඇමැති.

1962 මැයි 27 වැනිදා,
කොළඹ දී ය.

#### රෙගුලාසි

1. පනතේ 2 (1) වගන්තිය යටතේ නියම කළ යුතු හා ගෙවිය යුතු බද්ද පහත සඳහන් පුද්ගලයන් කිසිවකු වෙනුවෙන් නියම කිරීම හෝ ගෙවීම හෝ නො කළ යුතුයි.

(ඒ) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ විසින් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ පාලනය කරනු ලබන කිසියම් ගුවන් තොටුපළකින් ලංකාවෙන් පිටව යන්නා වූ කිසිදු පුද්ගලයකු.

(බී) රාජකීය ලංකා ගුවන් හමුදාවට අයිති ගුවන් යානයක් යුද්ධ කාර්යයන් හි යෙදී සිටිය දී, එබඳු ගුවන් යානයකින් ලංකාවෙන් පිටව යන කිසිදු පුද්ගලයකු.

(සී) විදේශීය ආණ්ඩුවකට අයිති යුද්ධ ගුවන් යානයක්, යුද්ධ කාර්යයන් හි යෙදී සිටියදී, එබඳු ගුවන් යානයකින් ලංකාවෙන් පිටව යන කිසිදු පුද්ගලයකු.

(ඩී) විදේශීය ආණ්ඩුවකට අයිති සිවිල් ගුවන් යානාවක්, දූත මණ්ඩලයක නිලධරයන් හෝ පුද්ගලයන් ගෙන යන ව්‍යාපාරික නො වන සංචාරයක යෙදී සිටියදී, එබඳු ගුවන් යානයකින් ලංකාවෙන් පිටව යන කිසිදු පුද්ගලයකු.

(ඊ) රාජකීය ලංකා නාවික හමුදාවට අයිති කිසියම් නෞකාවකින් ලංකාවෙන් පිටව යන කිසිදු පුද්ගලයකු.

(එෆ්) විදේශීය ආණ්ඩුවකට අයිති කිසියම් නෞකාවක්, යුද්ධ කාර්යයන් හී යෙදී සිටියදී එබඳු නෞකාවකින් ලංකාවෙන් පිටව යන කිසිදු පුද්ගලයකු.

(ජී) විදේශීය ආණ්ඩුවකට අයිති කිසියම් නෞකාවක්, දූත මණ්ඩලයක නිලධරයන් හෝ පුද්ගලයන් ගෙන යන ව්‍යාපාරික නො වන මුහුදු ගමනක යෙදී සිටිද්දී, එබඳු නෞකාවකින් ලංකාවෙන් පිටව යන කිසිදු පුද්ගලයකු.

(එච්) රාජ්‍යයේ ආගන්තුකයකු වන කිසිදු පුද්ගලයකු.

(අයි) ලංකාවට පැමිණ දින 3 ක් ඇතුළත දී ලංකාවෙන් පිටව යන කිසිදු පුද්ගලයකු.

(ජේ) ධනුෂ්කොඩියට යැම සඳහා තලෙයිමන්නාරමෙන් නැව් නගින කිසිදු පුද්ගලයකු.

2. (1) එබඳු නෞකාවක් හෝ ගුවන් යානයක් හෝ පිටත් වීමට පෙර, ඒ හැම නෞකාවකම හෝ ගුවන් යානයක හෝ ක්‍රියා කරවන්නා, එම නෞකාවෙන් හෝ ගුවන් යානයෙන් හෝ ලංකාවෙන් පිටව යන මගීන්ගේ ලැයිස්තුවක්, ඒ එක එක මගියා බද්ද ගෙවිය යුතුද නැද්ද යැයි සඳහන් කරමින්, නියම බලධාරිට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයකුට හෝ සැපයිය යුතුයි. තව ද එවැනි බද්දකට යටත් වන්නා වූ සෑම මගියකුගෙන්ම එම බද්ද අය කර ගත් බවට තද් ක්‍රියා කරවන්නා විසින් අත්සන් තබන ලද සහතික පත්‍රයක් ද සැපයිය යුතුයි.

(2) (1) වැනි ඡේදයේ යොමු කොට ඇති මගීන්ගේ ලැයිස්තුව හා සහතික පත්‍රය මෙහි උප ලේඛනයේ නියමිත "ඒ" පෝරමය අනුව ම විය යුතුයි.

(3) යම් හෙයකින්, ක්‍රියා කරවන්නා විසින් 1 වැනි ඡේද යෙන් උක්ත සහතික පත්‍රය, නියම බලධාරියාට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයාට නො සැපයුවහොත්, ප්‍රශ්න ගත ඒ නෞකාව හෝ ගුවන් යානාව, එ බඳු සහතික පත්‍රයක් සපයන තාක් කල්, නියම බලධාරියා හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයා විසින් හෝ නවතා තබනු ලැබිය හැක.

3. (1) තමා විසින් ක්‍රියා කරවනු ලැබූ නෞකාවෙන් හෝ ගුවන් යානාවෙන් හෝ ලංකාවෙන් ඒ ඒ දෙසතිය තුළදී පිටව ගිය මගීන් සංඛ්‍යාවත්, නෞකාවේ හෝ ගුවන් යානාවේ හෝ නම් හා ඒවා නික්ම ගිය දිනයන් ද යථෝක්ත මගීන්ගෙන් අයබදු මාර්ගයෙන් ක්‍රියා කරවන්නා විසින් එකතු කර ගත් මුදල් ප්‍රමාණයන් ද සඳහන් කරමින්, මෙයට අමුණා ඇති උප ලේඛනයේ නියමිත "බී" පෝරමය අනුව ම වූ ප්‍රකාශයක් සෑම දෙ සතියක් ම වෙනුවෙන් නියම බලධාරියාට, සෑම ක්‍රියා කරවන්නකු විසින් ම ඉදිරිපත් කළ යුතුයි.

(2) 1 වැනි ඡේදයේ යොමු කොට ඇති ප්‍රකාශය, එම ප්‍රකාශයෙන් කියැවෙන දෙ සතිය තුළදී බදු වශයෙන් එකතු කර ගත් මුළු මුදලක් සමග, එම දෙ සතියේ අවසානයේ සිට දින 16ක් ඇතුළත දී නියම බලධාරියාට ලඟා වෙන සේ එවිය යුතුයි.

4. මේ රෙගුලාසිවල—

"පනත" යනුවෙන් කියැවෙන්නේ 1961 කේ අංකය 19 දරණ නැව් නැගීමේ බදු පනතයි.

"සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ", "නියම බලධාරියා" සහ "ක්‍රියා කරවන්නා" යන පදවල අර්ථය පනතෙහි ඒ පදවල අර්ථය මැ වේ.

"බද්ද" යනු එමූ පනතේ 2 (I) වගන්තිය යටතේ නියම කළ යුතු හා ගෙවිය යුතු නැව් නැගීමේ බද්ද ය.

## උපලේඛනය

### "ඒ" ෆෝරමය

නියම බලධාරියා වෙත,

අනුක්‍රමික අංකය..............

නෞකාවේ/ගුවන් යානයේ නම: ....................................

පිටව ගිය තොටුපළ: ....................................

හඳුනා ගැනීමේ අංක හෝ ලකුණු:....................................

පිටව ගිය දිනය : ....................................

| අනුක්‍රමික අංකය | මගියාගේ නම | බද්දෙන් නිදහස් නම්, නිදහස් කළේ පනත යටතේ ද හෝ රෙගුලාසි යටතේද | ගොඩ බසින තොටුපළ |
|---|---|---|---|
| | | | |

යථෝක්ත ගුවන් යානයේ/නෞකාවේ ක්‍රියා කරවන්නා වූ..........................වන මම, අංක.................. දරණ මගීන් හැර මතු සඳහන් මගීන් සියල්ලගෙන් ම ගොඩ නැගීමේ බද්ද එකතු කර ගත් බව මෙයින් සහතික කරමි.

ක්‍රියා කරවන්නා.

### "බී" ෆෝරමය

....................................කාලය තුළ එකතු කරනු ලැබූ ගොඩනැගීමේ බද්ද පිළිබඳ ප්‍රකාශය.

| අනුක්‍රමික අංකය | නෞකාවේ හෝ ගුවන් යානයේ නම | ගොඩ නැගීම | ගොඩ බැසීම | පිටව යන දිනය | ගොඩ නැගීමේ බද්ද වශයෙන් එකතු කළ මුදල රු. ශත |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | එකතුව ... | |

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයා/කොමසාරිස්,

ඉහතින් යොමු කොට ඇති දෙ සතිය තුළ දී ගොඩ නැගීමේ බද්ද වශයෙන් එකතු කළ රු. ......................මේ සමග එවමි. මේ ප්‍රකාශය, ඒ ඒ නෞකාව/ගුවන් යානය වෙනුවෙන් ඔබට දැනටමත් ඉදිරිපත් කර ඇති ප්‍රකාශයන්ට අනුකූල වේ.

ක්‍රියා කරවන්නා.

6-369/2

---

## බන්ධනාගාර ආඥා පණත

වර්ෂ 1939 අංක 53 දරණ ආඥා පණතින් සංශෝධනය කොට වකී 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥා පණතේ 32 (1) (ආ) දරණ වගන්තියේ ප්‍රකාර, මෙහි උප ලේඛනයේ II වැනි තීරයේ සඳහන් තැනැත්තන්, මෙම දැන්වීමේ සඳහන් දින සිට එක් අවුරුදු කාලයකට, උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය සෝදිසි කොමිටියේ සාමාජිකයන් වශයෙන් කර්මාන්ත සවදේශ හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

ඒ. අයි. මොහිඩීන්
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ සථිර ලේකම් වෙනුවට.

1962 මැයි මස 31 වැනි දින, කොළඹ 7,
කර්මාන්ත ස්වදේශ හා සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශය.

### උප ලේඛනය

| I | II |
|---|---|
| වතුපිටිවෙල තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලීය බන්ධනාගාරය. | 1. පී. එච්. සෙනෙවිරත්න මහතා. 2. සී. ඊ. සෙනෙවිරත්න මහතා 3. මුහන්දිරම් ඩී. අලහියවන්න මහතා. |

6-394

ඇල්. සී—ඇල්. ඩී/120.

## කැළෑ ආඥාපනත

කැළෑ ආඥාපනතේ (451 වෙනි අධිකාරය) 12 වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල ඇමතිවරයා විසින් පනවනු ලබන ආඥාවයි.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග සහ විදුලිබල ඇමති.

1962. 5. 11,
කොළඹදීය.

### ආඥාව

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළේ පල්ලේපත්තුවේ ඇලපාත යන ගමේ පිහිටි කැකුණගොඩ මුකලාන, ගෝනමලදෙනිය මුකලාන, වඩුවලයැහේනේ මුකලාන, පොතුවිල මුකලාන සහ ගුරුගේහේන නැමැති ඉඩම් ගම්බද කැළෑවක් වශයෙන් සංස්ථාපනය කරනු ලැබූද, 1922 අප්‍රේල් මස 28 වෙනි දින හා අංක 7,254 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූද ප්‍රකාශනය, ඒ ගම්බද කැළෑවෙන් මෙහි උපලේඛනයෙහි නියමිත ප්‍රමාණයේ කොටසට ඒ ප්‍රකාශනය අදාලවන පමණට, මෙයින් අවලංගු කරනු ලැබේ.

### උපලේඛනය

අංක 75 දරන අවසාන ගම් පිඹුරෙහි අංක 11ඕ, 33ඕ, 34, 34ඕ හා 32 දරන බිම් කැබෙලි වශයෙන් දැක්වෙන අක්කර 45, රූඩ් 1, පර්. 36ක ප්‍රමාණය ඇති සියලු බිම් ප්‍රදේශය.

6-299

1949 අංක 51 දරණ ගල් ඔය සංවර්ධන මණ්ඩලීය පණතේ 3 (1) වැනි වගන්තිය යටතේ 1962 ජූනි 5 වැනි දින පටන් ගල් ඔය සංවර්ධන මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ඩබ්. ටී. අයි. අලගරත්නම් මහතා නැවත පත් කිරීමට ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිතුමා සතුටුවී ඇති බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පමුණුවනු ලැබේ.

ඩී. ජී. ඇල්. මීසෝ,
සථිර ලේකම්,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශය.

1962 ජූනි මස 2 දින,
කොළඹ.

6—411

---

## 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් රථ ගමනාගමන පනත

### 25 (1) වෙනි වගන්තිය යටතේ කෙරෙන නියෝගයයි

කම්කරු හා ජනසතු සේවා පිළිබඳ අමාත්‍ය ධුරන්ධර මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, මේ සමග ඇති උපලේඛනයෙහි දක්වා ඇත්තාවූද, ලංකා ගමනාගමන මණ්ඩලයේ කටයුතු සඳහා අත්කර ගැනීමට යෝජනා කර ඇත්තාවූද, නිශ්චල දේපළ අත්කර ගැනීම, 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් රථ ගමනාගමන පනතේ 25 වෙනි වගන්තියේ (1) වෙනි උප/වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට, මෙයින් අනුමත කරමි.

ඇම්. පී. ද ඉසැඩ් සිරිවර්ධන,
කම්කරු හා ජනසතු සේවා පිළිබඳ අමාත්‍ය තැන.

1962.5.23 වෙනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත් ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, මහනුවර නාගරික සභා ප්‍රදේශ සීමාව තුල, මහනුවර නාගරික ගම්මුලාදෑනි වසමේ, කටුකැලේ ගමේ පිහිටි, ප්‍රමාණයෙන් පර්චස් 17ක් පමණවූ බිම් කැබැලි දෙකක්.

2. (ඒ) කැබැල්ල :—

උතුරට : ලංගම ඩිපෝව ; දකුණට : එම ඉඩමේ කොටස ; නැගෙනහිරට : එම ඉඩමේ කොටස සහ මහනුවර ඇස්. ජී. ප්‍රනාන්දුට අයත් ඉඩම ; බස්නාහිරට : ලංගම ඩිපෝව.

(බී) කැබැල්ල :—

උතුරට : ලංගම ඩිපෝව ; දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස සහ කොළඹ, ඇම්. ඇස්. හසීම්ගේ ඉඩම ; නැගෙනහිරට : මහනුවර, රණසිංහට අයත් ඉඩම ; බස්නාහිරට : කොළඹ, ඇම්. ඇස්. හසීම්ගේ ඉඩම.

3. අයත්කර ගැනීමට ඇති ඉඩම් කැබලිවල විස්තර මෙසේ ය :—

(ඒ) කැබැල්ල :—

ඉඩමේ නම : නමක් නොමැතියි ; වගාව : මුඩු බිම ; වර්ග ප්‍රමාණය : පර්චස් 7ක් පමණ ; අයිතිකරුගේ නම සහ ලිපිනය : ඇම්. ඇස්. හසීම්, 52 පෙන්ඩනිස් ඇවනියු, කොළඹ 3.

(බී) කැබැල්ල :—

ඉඩමේ නම : නමක් නොමැතියි ; වගාව : වත්ත ; වර්ග ප්‍රමාණය : පර්චස් 10ක් පමණ ; අයිතිකරුගේ නම සහ ලිපිනය : ඇස්. ජී. ප්‍රනාන්දු, පේරාදෙනිය පාර, මහනුවර.

6—392

---

ජීර්/2055.

## ධීවර ආඥාපනතේ (212 වැනි ඡෙදය) 20 (9) වැනි වගන්තිය යටතේ පළකරන නිවේදනයයි

මන්නාරම් ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරිගේ කොට්ඨාශයේ මූසාලි ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරිගේ කොට්ඨාශය හා මාන්තායි ආදායම් පාලක නිලධාරිගේ කොට්ඨාශය යන කොට්ඨාශවල ස්ථිර ලෙස පදිංචි ධීවර කාර්මිකයන් හා මීගමුව හා අනිකුත් ප්‍රදේශවලින් සංක්‍රමණය වෙන ඔරු හා යාන්ත්‍රික යාත්‍රා ධීවර කාර්මිකයින් අතර, මන්නාරම මූසාලි හා මන්තායි ප්‍රාදේශීය ආදායම් පාලක කොට්ඨාශවල වෙරළ බඩ ප්‍රදේශයට යාබද ලංකාව සතු මුහුදෙහි ඔවුනොවුන්ගේ මස් මැරීමේ අයිතිවාසිකම් පිළිබඳව පැන නැගී ඇති ආරාවුල විභාග කර රපෝර්තු කිරීමට පත් කරන ලද සමථයට පමුණුවන නිලධාරි තැනගේ වාර්තාව මහජනයාගේ දැනගැනීම පිණිස මෙහි පළ කරනු ලැබේ.

මෙම ධීවර අරගලයෙන් හිරිහැරයට පත් කෙනෙක් හෝ මීට සම්බන්ධ වන යමකින් හෝ ඊට හේතුවන යමකින් හෝ හිරිහැරයට පත්වූයෙක් හෝ මේ වාර්තාවේ සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට කැමති වේ නම් මේ නිවේදනය පළවන දිනයේ සිට මාසයක් ඉකුත් වන්නට පෙර ලියවිලි මාර්ගයෙන් ඒවා කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ ඇමතිතුමා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

ඇම්. ශ්‍රීකාන්ත,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්.

1962 මැයි මස 28 වැනි දින,
කොළඹ,

### මන්නාරම් ධීවර අවුල

### වාර්තාව

ඉහත් සඳහන් ආරාවුල පිළිබඳව ප්‍රසිද්ධ විභාගයක් පැවැත්වීම කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල පිළිබඳ ගරු ඇමතිතුමාගෙන් ලැබුණු 1961 මාර්තු 6 දින දරන ලිපියකින් මා වෙත පැවරිණ. එම ලිපියේ පාඨය මෙසේ යි :

"1952 අංක 25 හා 1956 අංක 30 දරන ධීවර (සංශෝධන) පනත්වලින් සංශෝධිත, 1940 අංක 24 දරන ධීවර ආඥා පනතේ 18ඒ (1) වගන්තිය ප්‍රකාර, මන්නාරම් ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරිගේ කොට්ඨාශය, මූසාලි ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරිගේ කොට්ඨාශය, මන්තයි ප්‍රාදේශීය සථිර ලෙස පදිංචි ධීවර කාර්මිකයින් සහ මීගමුව හා අනිකුත් ප්‍රදේශවලින් සංක්‍රමණය වන ඔරු හා යාන්ත්‍රික යාත්‍රා ධීවර කාර්මිකයින් අතර, මන්නාරම්, මූසාලි සහ මාන්තයි ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරිගේ කොට්ඨාශය, මූසාලි ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරීන්ගේ කොට්ඨාශවල වෙරළබඩ ප්‍රදේශයට යාබද ලංකාව සතු මුහුදෙහි ඔවුනොවුන්ගේ මස් මැරීමේ අයිතිවාසිකම් පිළිබඳව පැන නැගී ඇති ආරාවුලක් ගැන ප්‍රසිද්ධ විභාගයක් පවත්වා වාර්තාකිරීම මම ඔබට පවරමි.

2. ආරාවුලට අඩංගු කරුණු මෙසේ ය :—

මන්නාරම් ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරිගේ කොට්ඨාශය මූසාලි ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරිගේ කොට්ඨාශය සහ මාන්තයි ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරිගේ කොට්ඨාශය ආදී කොට්ඨාශවල සථිර ලෙස පදිංචිව සිටින ධීවර කාර්මිකයෝ, මන්නාරම, මූසාලි සහ මාන්තයි ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරීන්ගේ කොට්ඨාශවල වෙරළ බඩ ප්‍රදේශයට යාබද ලංකාව සතු මුහුදෙහි මසුන් මැරීමේ සම්පූර්ණ අයිතිවාසිකම ඉල්ලා සිටිති. මීගමුව හා අනිකුත් ප්‍රදේශවලින් සංක්‍රමණය වන ඔරු හා යාන්ත්‍රික යාත්‍රා ධීවර කාර්මිකයින්, මෙම ප්‍රදේශවල මුහුදෙහි හා එයට යාබද ප්‍රදේශවල මුහුදෙහි මසුන් ඇල්ලීම නිසා තමන්ගේ ධීවර කටයුතුවලට බාධා ඇතිවේයයි සථිර ලෙස පදිංචි ධීවර කාර්මිකයෝ චෝදනා කරති. සංක්‍රමණය වන ඔරු හා යාන්ත්‍රික යාත්‍රා ධීවර කාර්මිකයින් විසින් මන්නාරම, මූසාලි සහ මාන්තයි ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරීන්ගේ කොට්ඨාශවල වෙරළබඩ ප්‍රදේශයට යාබද ලංකාව සතු මුහුදෙහි මසුන් මැරීම සහ එම මුහුදු ප්‍රදේශයේ සිට ක්‍රියා කිරීම තහනම් කරන ලෙස ඔවුහු ඉල්ලා සිටිති.

මීගමුව සහ අනිකුත් ප්‍රදේශවලින් සංක්‍රමණය වන සමහර ඔරු ධීවර කාර්මිකයින් තමන් මෙම මුහුදු ප්‍රදේශයෙහි දීර්ඝ කාලයක් තිස්සේම මසුන් මැරීමෙහි යෙදී සිටි බව කියා සිටින අතර සංක්‍රමණය වන ධීවර කාර්මිකයින් සියල්ලෝම මෙම මුහුදු ප්‍රදේශයෙහි මසුන් මැරීමට තමනටත් අයිතිවාසිකම් ඇතැයි කියා සිටිති. තවද, ඔවුනගේ මසුන් මැරීමේ විධි නිසා මන්නාරම, මූසාලි සහ මාන්තයි ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරීන්ගේ කොට්ඨාශවල සථිර ලෙස පදිංචි ධීවර කාර්මිකයින්ගේ මසුන් ඇල්ලීම් කෙරෙහි අහිතකර බලපෑමක් ඇති නොවන්නේ යැයි ඔවුහු කියා සිටිති.

3. මෙම ආරාවුලට අඩංගු කරුණ පිළිබඳ පමණක් නොව මෙම වගන්තියේ විධි විධානවලට අනුකූලව ඔබ වෙත ඉදිරිපත් කෙරෙන යම් යම් සාක්ෂිවලින් මෙම ආරාවුලට අදාලව පැන නගින්නාවූ සියළු ම කරුණු පිළිබඳවත් ප්‍රසිද්ධ පරීක්ෂණයක් පවත්වා වාර්තා කරන ලෙස ඔබෙන් ඉල්ලා සිටිමි.

මෙයට,

ඔබගේ යටහත් සේවක,

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග සහ විදුලිබල පිළිබඳ ඇමති."

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 1956 යේ ප්‍රතිශෝධිත මුද්‍රණයෙහි, ධීවර ආඥාපනත 212 වැනි පරිච්ඡේදය ලෙස දක්වා ඇති බවත් ආරාවුලක් පිළිබඳව ප්‍රසිද්ධ පරීක්ෂණයක් පවත්වා වාර්තා කිරීම කිසියම් පුද්ගලයෙකුහට භාර කිරීමේ බලතල ඇමතිතුමාහට පැවරෙන වගන්තිය දැන් 20 (1) ලෙස නොම්මර යොදා ඇති බවත් මෙහි සඳහන් කරනු කැමැත්තෙමි. මා මෙය සඳහන් කරන්නේ, පරීක්ෂණයෙහි දී භාවිතා කරනු ලැබුවේත් මූලික අවශ්‍යතාවයන් පිළිබඳ කරුණු හැර අන් සියළු කරුණු සම්බන්ධයෙන් මෙම වාර්තාවෙහිදී භාවිතා කරනු ලබන්නේත් ව්‍යවස්ථාපිත අණපනත්වල අළුත්ම මුද්‍රණය හෙයින් ය.

1952 අංක 25 දරන ධීවර (සංශෝධිත) පනතේ 18ඒ (3) වගන්තිය ප්‍රකාර, මෙම ආරාවුල පිළිබඳ සැලකිලිමත් වන සියළු දෙනාගෙන්ම 1961 මාර්තු 17 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියවිලි මගින් ඉදිරිපත් කෙරෙන කරුණු ඉල්ලමින්, 1961 මාර්තු 10 දින අංක 12,314 දරණ රජයේ ගැසට් පත්‍රයේද පළවූ, 1961 මාර්තු 7 දාතමින් යුත් දැන්වීමක් නිකුත් කළෙමි. මේ පිළිබඳ ප්‍රසිද්ධ පරීක්ෂණය 1961 මාර්තු 28 දින මන්නාරමෙහිදී මා ආරම්භ කරන බවද· ඒ සමගම දැනුම් දුන්නෙමි. කරුණු ඉදිරිපත් කෙරෙන ලියවිලි 13ක් ලැබුණි.

මාර්තු 28 වැනිදා ඇරඹුණු ප්‍රසිද්ධ පරීක්ෂණය හදිසි අවස්ථා රෙගුලාසි යටතේ පනවනු ලැබූ ගමනාගමන සීමාකිරීම් නිසා දිගටම පවත්වාගෙන යා නොහැකි විය. කෙසේ වෙතත්, එක් එක් පාර්ශ්වයේ නියෝජිතයින්හට, තම තමන්ගේ ඉල්ලීම් සහ අයිතිවාසිකම්වල තත්වය පිළිබඳ සාරාංශ ඇතුළත් දේශන පැවැත්වීම සඳහා ඉඩකඩ සැලසීමට අවසථා යොදා ගන්නා ලදී. මෙම ප්‍රදේශයන්හි සථිර ලෙස පදිංචි ධීවර කාර්මිකයින් විසින් මීගමුවෙන් සංක්‍රමණය වන ඔරු ධීවර කාර්මිකයින්හට විරුද්ධව තදබල චෝදනා නොනගන බව පරීක්ෂණය ඇරඹුණු ඉක්මණින්ම වාගේ පෙනී ගියේය. ඇත්ත වශයෙන්ම මොවුන් දෙපක්ෂයම එකමුතු වී මීගමුව ප්‍රදේශයෙන් සංක්‍රමණය වන යාන්ත්‍රික යාත්‍රා ධීවර කාර්මිකයින් හට එරෙහිව කරුණු දක්වීමට එකඟත්වයක් දක්වූහ.

පනවනු ලැබූ රෙගුලාසි කිසිවක් නොවූයෙන්, අනුගමණය පිණිස මගේම ක්‍රියා මාර්ගයක් යොදා ගැනීමට මට සිදු විය. ප්‍රදේශයේ නිවැසි ධීවර කාර්මිකයින්, මෙම ආරාවුලෙහි තමන්ගේ තත්වය පිළිබඳව කරුණු ගෙනහැර දැක්වීම, පළමුවෙන්ම, කළ යුතුයැයි තීරණය විය. කොමසාරිස් වශයෙන්, අවශ්‍ය අවස්ථාවන්හිදී, රජයේ සේවකයින්ද කැඳවීමි. එහෙත් සාමාන්‍යයෙන් උසාවි වල පරීක්ෂණ පැවැත්වෙන ආකාරයම අනුගමනය කෙරිණ.

"හදිසි අවස්ථා"වේ තදබල කම් ලිහිල් වූ පසු ප්‍රසිද්ධ පරීක්ෂණය 1961 නොවැම්බර් 15 දින යළිත් ඇරඹුණි. ප්‍රදේශයේ නිවැසි ධීවර කාර්මිකයින් සහ ඔරු ධීවර කාර්මිකයන් වෙනුවෙන් පෙනී සිටි නවරත්නම් මහතා, මීගමුවෙන් සංක්‍රමණය වන යාන්ත්‍රික යාත්‍රා ධීවර කාර්මිකයින් කර ඇති පරිදි ඔහුගේ අනුග්‍රාහකයින් හට ජ්‍යෙෂ්ඨ නීතිඥයෙකුගේ සේවය ලබා ගැනීමට නොහැකි වූ හෙයින් පරීක්ෂණය යළිත් කල් තබන ලෙස ඉල්ලුම් කෙළේය. අවසාන යේදී සෑම පක්ෂයකම කැමැත්තෙන් ප්‍රසිද්ධ පරීක්‍ෂණයේ ඉතිරි කොටස කොළඹ දී පවත්වනු ලැබීය.

මගේ වාර්තාව සම්පූර්ණ කිරීමට මෙතරම් කාලයක් ගතවූ හේතුව මින් පැහැදිලි වේ. ලුහුඬින් දක්වතොත් ප්‍රසිද්ධ පරීක්ෂණය, දින එකොළහක් තිස්සේ එනම්, 1961 මාර්තු 28, නොවැම්බර් 15, දෙසැම්බර් 13, 14 සහ 15ත්, 1962 ජනවාරි 17, 18, 19, 20, 22 සහ 23ත් යන දිනවලදී පැවැත්වීමි. මීට අමතරව 1961 නොවැම්බර් 14 වැනිදාත්, 1962 ජනවාරි 30 වැනිදාත් මන්නාරම් වෙරළ පුද්ගලිකව පරීක්ෂා කර බැලීමි.

**මසුන් මැරීමේ අයිතිවාසිකම්**

කරුණු ගැන සාකච්ඡා කිරීමට පෙරාතුව, මසුන් මැරීමේ අයිතිවාසිකම් පිළිබඳව නිරීක්ෂණ කිහිපයක් ඉදිරිපත් කිරීම මැනවැයි සිතමි. උගත් නීතිඥවරු මාහට නීතිය පැහැදිලි කරදී ශ්‍රෙෂ්ඨාධිකරණ නඩු තීන්දු කිහිපයක්ම මා හමුවට ඉදිරිපත් කළහ. මදප්පුලි, ප්‍රැට්රික් හට විරුද්ධව පැවරූ නඩුවේ 54 න. නී. වා. 366 හි මේ පිළිබඳ නීතිය සවිස්තරව විභාග වී ඇති අතර මෝදර-පටුවත සමූපාකාර ධීවර සමිතිය ගුණවර්ධන හට විරුද්ධව පැවරූ නඩුවේ, 62 න. නී. වා. 189 හි එය තහවුරු වී ඇත. මෙම නඩු තීන්දු දෙකම මෑතකදී දෙනු ලැබූ. ඒවා වනවාත් හැර එම තීන්දු දී ඇත්තේ ධීවර ආඥපනත බල පවත්වන්නට වූ පසුවය.

එම නිසා, සම්මුති නීතිය යටතේ පොදු ජන සමාජයේ සෑම සාමාජිකයකුහටම විවෘත මුහුදේ ඕනෑම කොටසක මසුන් මැරීමට එක සමාන අයිතිවාසිකමක් ඇතැයි නියම වේ. එසේ වෙතත්, ව්‍යවස්ථා මාර්ගයෙන් මෙම අයිතිවාසිකම් සීමා කිරීම නියම කිරීම හෝ අවලංගු කිරීම වුවත් කළ හැකිය. ඇත්ත වශයෙන්ම ලංකාවේ බලපවත්වන තත්වය මෙයයි. උදාහරණයක් වශයෙන් 212 පරිච්ඡේදය වන ධීවර ආඥපනතේ 33 (1) දරණ වගන්තිය, "ධීවර කර්මාන්තය විධිමත් කිරීම සහ පාලනය කිරීම සඳහා, ලංකාව සතු ජලාශයන්හි මසුන් ආරක්ෂා කිරීම සඳහා, සහ සාමාන්‍යයෙන් මෙම ආඥපනතේ විධි විධාන සහ මූල ධර්ම ඉටුකිරීම හෝ ක්‍රියාත්මක කරවීම සඳහා" රෙගුලාසි පැනවීමට, ඇමති තුමාට බලය දෙයි.

එහෙයින්, "ලංකාව සතු ජලාශයන්" ප්‍රයෝජනයට ගැනීමට පුද්ගලයින්හට ඇති අයිතිවාසිකම් එසේම තිබියදී එම අයිතිවාසිකම් අඩු කිරීම හෝ අවලංගු කිරීම වුවත් හෝ කිරීමට ධීවර කටයුතු භාර ඇමති තුමාට බලය තිබේ. එසේද වුවත්, "ලංකාව සතු ජලාශයන්" ගෙන් ඔබ්බෙහි මසුන් මැරීම පාලනය කිරීමට ධීවර ආඥපනතින් ඇමති තුමාට බලයක් නොපැවරෙන බවද සටහන් විය යුතුය.

ව්‍යවහාර රීති පිළිබඳව නම්, භාවිතය නිසා යම් යම් අයිතිවාසිකම් ස්ථාවර වේද්දී ඒ හා සමාන අනෙක් අයිතිවාසිකම් කිසි විටෙක සම්පූර්ණයෙන්ම නැති කළ නොහැකි බව මදප්පුලි පැට්රික් හට විරුද්ධව පැවරූ නඩුවේ තීන්දුවෙන් පැහැදිලි වේ. ව්‍යවහාර රීතිය කට ගිවිසුමක බලපෑම ලැබිය හැක්කේ එය බොහෝ කාලයක් තහවුරුව පැවති බව ඔප්පු වුවහොත් සහ එය සාධාරණ වුවහොත් පමණකි. එතකුදු වුවත් ව්‍යවහාර රීති යම් විශෙෂ අවස්ථාවකදී ගැටළු මඟ හරවා ගැනීම සඳහා කණ්ඩායම් හෝ පක්ෂ අතර යොදා ගන්නා පිළිවෙළවල්ය. ව්‍යවහාර රීතියක් බලපවත්වන ජලාශයක එය බල පැවැත්වීම ඇරඹුණු පසු වෙනත් කණ්ඩායම් හෝ පක්ෂ එම ජලාශ යටම තමන්හටද ඇති අයිතිවාසිකම් භුක්ති විඳීමට තෝරා ගතහොත් එම ව්‍යවහාර රීතිය කෙරෙහි ඔවුන්ගේ බැඳීමක් ඇති කළ නොහැකිය. "අනාගතයෙහි මතුවිය හැකි දුෂ්කරතාවයක් සම්බන්ධයෙන් බල පැවැත්විය හැකි නියමයක් බිහි කිරීම ව්‍යවහාර රීතියකට කළ නොහැකිය." භාවිතාවන ව්‍යවහාර රීතියක්, රෙගුලාසි පැනවීමෙන්, නොනවත්වා බලපැවැත්වීමට ධීවර කටයුතු භාර ඇමතිවරයාහට බලය ඇති බව කිවමනා නොවේ.

**ලංකාව සතු ජලාශ**

ධීවර ආඥපනත යටතේ රෙගුලාසි පැනවිය හැකි ජලාශයන් නම් "ලංකාව සතු ජලාශයන්" ය. 212 පරිච්ඡේදයේ 35 වගන්තිය මෙම වාක්‍යඛන්ඩය පැහැදිලි කරන්නේ මෙසේය :

"ලංකාව සතු ජලාශයන්" හට

(අ) ලංකාවට අයත් මුහුදු ප්‍රදේශය, සහ

(ආ) සියළුම පොදු මුහුදු බොක්කවල්, ගංගා, කලපු, මෝයවල්, ඇළදොළ, ඔය ඈ කුඩා දියපාරවල්, වැව්, දියකඩිති, පොකුණු සහ ඇළවල් ද ඇතුළු වෙනත් සියළුම පොදු ගොඩතර ජලාශයන් අයත් වේ.

"ලංකාවට අයත් මුහුදු ප්‍රදේශය" යනුවෙන් ගැනෙන්නේ ලංකා වෙරළේ ඕනෑම තැනක සාමාන්‍යයෙන් අධික වඩදිය කාලයේදී ඇති අඩුම ජල සීමාවේ සිට, මණිනු ලැබූ මුහුදු සැතැප්ම තුනක දුර ප්‍රමාණයක් ඇතුලත පිහිටි සමුද්‍ර ප්‍රදේශයය.

මෙතෙක් දුරට නම් නීතිය පැහැදිලිය. එහෙත් ප්‍රදේශයේ නිවැසි ධීවර කාර්මිකයින් වෙනුවෙන් පෙනී සිටින නීතිඥයෝ අංක 11,222 සහ 1957 දෙසැම්බර් 20 දින දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ මහා රාජිණියන්වහන්සේගේ නාමයෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් 1957 දෙසැම්බර් 19 දාතමින් නිකුත් කරන ලද නිවේදනයකට මගේ අවධානය යොමු කරවති. එම නිවේදනය මෙසේය :

"රාජ්‍යයක ස්වාධිපත්‍යය, එම රාජ්‍යයට අයත් මුහුදු ප්‍රදේශය යැයි පොදුවේ හැඳින්වෙන එහි වෙරළට යාබදව පිහිටි සමුද්‍ර තීරයටත්, පැතිරෙන බව ජාත්‍යන්තර නීතිය පිළිගන්නේ වී නමුත්, රාජ්‍යයකට අයත් මුහුදු ප්‍රදේශයේ ප්‍රමාණය සම්බන්ධයෙන් ජාත්‍යන්තර ව්‍යවහාරය එක හා සමාන නොවන හෙයින්, ලංකාව සතු මුහුදු ප්‍රදේශයේ ප්‍රමාණය ප්‍රකාශයට පත් කිරීම අවශ්‍ය වී ඇත. දැන් එසේ හෙයින්, ලංකාවේ අග්‍රාණ්ඩුකාර ඔලිවර් අර්නස්ට් ගුණතිලක වන මම, ලංකාව හෝ ඉන් කොටසක් හෝ සම්බන්ධයෙන් මෙයට පටහැණිව පනවන්නට යෙදුණාවූ නීත්‍යානුකූල හෝ ව්‍යවහාරානුකූල යම්කිසි අණක් වේ නම් ඒ හැමෙකක්ම අභිබවමින්, ලංකාව සතු මුහුදු ප්‍රදේශය, ඊට අදාල පාදයේ සිට මණිනු ලැබූ මුහුදු සැතැප්ම හයක දුර ප්‍රමාණයක් දක්වා, මුහුදට විහිද යා යුතු යැයි මෙම නිවේදනයෙන් ප්‍රකාශ කර සිටිමි."

මෙම නිවේදනයේ නියමයන් ගැන මම සුපරීක්ෂාකාරීව සලකා බැලුවෙමි. එය ලංකා වෙරළට යාබදව පිහිටි සැතපුම් හයක සමුද්‍ර තීරයක් කෙරෙහි ලංකා රාජ්‍යයේ ආධිපත්‍යය ප්‍රකාශයට පත්කිරීම සඳහා පමණක් වූ නිවේදනයක් ලෙසය මට පෙනී යන්නේ. බල පවත්වන නීති කිසිවක් සංශෝධනය කිරීම ඉන් අදහස් නොකරන නමුත්, අවශ්‍ය වුවහොත්, මේ රටට අයිති මුහුදු ප්‍රදේශයේ පුළුල් කරන ලද තීරුව තුළ කෙරෙන යම් යම් කටයුතු සඳහා ව්‍යවස්ථා පැනවීමේ අයිතිවාසිකමක් එය කියා සිටී.

එම නිසා, මෙම නිවේදනයෙන් ධීවර ආඥපනතේ නියමිත විග්‍රහය යටපත් නොවේයයි මම නිගමනය කරමි. ඉන් කෙරෙන දෙය නම්, ආඥපනතේ සඳහන් මෙරටට අයත් මුහුදු ප්‍රදේශයේ සීමාවන් සංශෝධනය කිරීම සඳහා, ව්‍යවස්ථා පැනවීමේ මණ්ඩලයට ඉඩ සලසා දීම පමණකි. මෙම සංශෝධනය නොකෙරී ඇති හෙයින්, මුහුදු සැතපුම් තුනේ සීමාවෙන් ඔබ්බෙහි ධීවර කටයුතු පාලනය කිරීම සඳහා රෙගුලාසි පැනවීමට ධීවර ආඥ පනතින් බලයක් නො පැවරේ.

**මාදැල් යොදා මසුන් මැරීම**

මෙම පරීක්ෂණයෙහි එක් පක්ෂයක් වන ප්‍රාදේශීය ධීවර කාර්මිකයෝ "මාදැල" යැයි හැඳින්වෙන (ඉංග්‍රීසියෙන් "බීච්-සේන්" දෙමළෙන් "කරවලෙයි") විශාල දැලක් භාවිතා කරති. "පාඩු" යැයි හැඳින්වෙන මුහුදු වෙරළේ බිම් තීරුවක් ඉදිරියෙන් මුහුදේ එලනු ලබන එවැනි දැලක් ඊට යාකර ඇති ලණු වලින් ගොඩට අදිනු ලැබේ. මන්නාරම් දූවෙහි "පාඩු"වක දිග සැතැපුම් කාලක් පමණවේ. දැලෙහි ඈතම කෙළවර වෙරළේ සිට සැතැපුම් දෙකක් හෝ ඊට වඩා දුර විහිදේ. මේ අන්දමේ මසුන් මැරීම විශාල ජලබිම් පෙදෙසක වෙසෙන මසුන් උගුලට හසුකෙරෙන වටකිරීමේ ක්‍රමයක් බව පෙනී යනවා ඇත.

මෙසේ අල්ලාගනු ලබන මසුන් බොහෝ විට දැල් එලන ප්‍රදේශය තුල ජීවත් වන්නන් විය හැකි වෙතත් මෙම ක්‍රමයේ සඵලත්වය වැඩිදුරටත් රඳාපවත්නේ ආහාරය, උත්පාදනය යනාදිය සඳහා මහාමීපික තටකය වටා සැරිසරමින් නිතර නිතර වෙරළ කරාත් ඇදෙන මාළු රැන් වටකර ගැනීමෙහිය. සමහර අවස්ථාවලදී මෙවැනි මාළු අයින් කලින් දකගෙන වටකර ගනිතත් බොහෝ අවස්ථාවලදී එසේ කෙරෙන්නේ අහම්බෙන්ය. වෙරළ කරා ඇදී එන මසුන් අත් අතකට හරවා යවන යම් මසුන් ඇල්ලීමේ ක්‍රමයක් වේ නම්, එයින්, දැල එලන පෙදෙසට මසුන් ඇතුළුවීම උඩ රඳා ඇති මාදැල් එලීමෙන් මසුන් මරන ක්‍රමය කෙරෙහි, අහිතකර බලපෑමක් ඇති වන බව පෙන්නාදීම පමණක් සෑහේ.

මාදැල් එලීම, සම්භවයෙන් ආදිකාලීන වූත්, තව බොහෝ දුර දියුණු කළ යුත්තාවූත්, උපක්‍රමයක් විය හැකිසි. එසේද වුවත් ලංකාවේ මසුන් මැරීමෙහි ලා ඉතාම විශාල සේවය ඉටු කරන වැදගත්ම උපක්‍රමය එය බව කිවමනා නොවේ. "පී 20" හි සඳහන් සංඛ්‍යා වැරදි සහිත බව පිළිගෙන ඇතත් මසුන් මැරීමේ උපක්‍රමයන් පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් ගෙන දීමට සෑහෙන තරම් එම සංඛ්‍යා පිළිගත හැකියයි මම සිතමි. ලංකාවේ ගොඩදමනු ලබන මසුන්ගෙන් සියයට 40 ටත් 50 ටත් අතර ප්‍රමාණයක් එන්නේ මාදැල් එලීමෙන් බව පෙනී යන අතර ඉන් සියයට 10 ක්ම, වෙලීමටත් සමඟ අවුරුද්දකට මාළු රාත්තල් පණස් ලක්ෂයක් පමණ නිපදවන, මන්නාරම් දිස්ත්‍රික්කයෙනි. මෙය ලැබෙන්නේ "පාඩු" 68 කින්ය. (පී. 30) බලන්න. අදක්ෂ ලෙස මෙහෙයවනු ලබන "පාඩු" හැරුණාම එක් හොඳ "පාඩු"වකින් අවුරුද්දකට මාළු රාත්තල් 100,000 ක් පමණ ගොඩදමනවා විය යුතුය. මෙම ආරාවුලට තුඩු දුන් ප්‍රධානතම ප්‍රදේශයෙහි, එනම්, මන්නානාරම් දූවේ දකුණු වෙරළෙහි, අවුරුද්දක සාමාන්‍ය ගණන සමහර විට මීට වඩා වැඩිවිය හැකිය.

මන්නාරම් දිස්ත්‍රික්කයේ මාදැල් කරුවන්ගේ ජනගහනය දැක්වෙන විශ්වාසය තැබිය හැකි සංඛ්‍යා වාර්තා නොමැතිවුවත් "පාඩු" වකට 50 බැගින්වූ පදනමකින් ගණන් බැලූවහොත් කෙළින් ම මාදැල් එලීමෙහි නියුක්ත වූවන්ගේ ගණන 3400 කි. මේ අනුව අවුරුද්දකට ගොඩ දමන මාළු ප්‍රමාණය එක් අයෙකුට රාත්තල් 1500 ක් වේ. අවුරුද්ද මුළුල්ලේම සෑම ස්ථානයකම මසුන් මැරිය නොහැකි හෙයින් මේ ගණන එක් අයෙකුට එක් දිනකට රු. 7 ක් යැයි ගත හැක. මෙය "පී 11" හි 3 වන පරිශිෂ්ඨයෙහි—ලංකා මාදැල් එලීමේ කර්මාන්තය පිළිබඳව සඳහන් සංඛ්‍යා සමඟ ඉතාම කිට්ටුවෙන් සැසඳෙන හෙයින් මෙම කර්මාන්තයෙහි නියුක්තවූවන්ගේ ජනගහනය ගණන් බැලීම එතරම්ම වැරදි සහිත විය නොහැකිය. එහෙත් එම ගණනට මාදැල් කරුවන්ගෙන් යැපෙන්නන් හෝ මෙම කර්මාන්තයෙන් අනියම්ව රක්ෂා ලබන්නන් හෝ ඇතුළත් නොවේ.

මුහුදු වෙරළ රජය සතුවූවකි. මෑතකදී ධීවර කර්මාන්තයට පිවිසි ගම්වාසීන් කිහිපදෙනෙකුට මන්නාරම් දූවෙහි "පාඩු" බලපත්‍ර කිහිපයක් දිසාපති තැන විසින් නිකුත් කර ඇත. එහෙත් "පාඩු" බොහොමයක්ම සම්බන්ධයෙන් බලපත්‍ර ලබාගෙනම නැත. මසුන් මරන්නන් පදිංචි ගම්, වෙරළේ තීරු භාවිතා කිරීමේ වරප්‍රසාදය භුක්ති විඳ ඇත. ආරාවුල් වැළැක්වීම උදෙසා ඒ ඒ ගම්වල "පාඩු" වෙන් කෙරෙන බිම් සලකුණු පිහිටුවා තිබේ. එක් ගමකට යාව පිහිටි මුහුදු වෙරළ සම්මුතියෙන් සම්මාතිවරුන් (දැල්හිමියන්) බෙදාගෙන ඇත. මේ අයනම් දැල් අයිතිව මසුන් ඇල්ලීම කරවන පුද්ගලයෝය. "පාඩු" වලට වඩා සම්මාතිවරුන් (දැල්හිමියන්) වැඩි හෙයින් මාරුවෙන් මාරුවට වාරය පැමිණවීමේ ක්‍රමයක් අවශ්‍ය වේ. වෙන වචනවලින් කියතොත් මන්නාරම් දූවෙහි පිහිටි සියළුම යෝග්‍ය "පාඩු" පාවිච්චියට ගනු ලැබුවා පමණක් නොව තව දුරටත් ඒවා එසේම පාවිච්චියට ගනු ලබන්නේද වෙයි.

මෙම කරුණු ගැන සළකා බලන විට පෙනී යන්නේ, මනා ලෙස සංවිධානය වූ කර්මාන්තයක මූලික ලක්ෂණ වලට බාධාකිරීම නුවණට හුරු නොවන්නාවූත් පල ප්‍රයෝජන ගෙන නොදෙන්නාවූත් දෙයක් බවය. එය එසේ වුවත්, දැන් පවත්නා තත්වය සම්පූර්ණයෙන්ම එසේම පවත්වාගෙන යා යුතුයැයි කිසිවෙකුටවත් සාධාරණව යෝජනා කළ නොහැකිය. මාදැල් එලා මසුන් මැරීමේ උපක්‍රමයෙහි වැඩි දියුණුවට බොහෝ ඉඩකඩ ඇති බව පර්යේෂණ නිලධාරි ආචාර්ය කනකරත්නම් මහතාගේ සාක්ෂියෙන් පැහැදිලිවේ. මන්නාරමෙහි මාදැල් එලන්නන් හටම පරවේණිවූ අයිතිවාසිකමක් පැන නැඟීමේ ප්‍රශ්නයක් නොමැති බවත් එසේම පැහැදිලිය. මසුන් මැරීමේ වෙනත් උපක්‍රමයනගේ ව්‍යාප්තිය සඳහාද ඉඩ තිබිය යුතුමය. මෙහිලා ව්‍යවහාර රීතිවල බලපෑම පිළිබඳව මා මීට පෙර ගෙන හැර දක්වන්නට යෙදුණු කරුණු ගැනද සිහිපත් කරවනු කැමැත්තෙමි. අළුත් පන්න ක්‍රමයන් භාවිතයට ගෙන මන්නාරම් මුහුදු ප්‍රදේශයෙන් පලප්‍රයෝජන ලබාගැනීමට ඉදිරිපත්වන ධීවර කාර්මිකයින් බැඳතැබීම ව්‍යවහාර රීතිවලට කළ නොහැකිය.

### ඔරුවලින් මසුන් මැරීම

"ඔරු" නම් රුවල් යෙදූ, කොල්ලෑව සහිත හබලෙන් පදින යාත්‍රාවෝ වෙති. වෙරළේ සිට සැතපුම් විසිපහක් පමණ දුරක් ඔරුවකට යා හැකි වෙතත් සාමාන්‍යයෙන් එතරම් දුර යාත්‍රාකරනු නොලැබේ. එහි ගමන්වේගය සුළඟින් හා දිය වැල් වලින් සීමිතවේ. මන්නාරම අසල මසුන් මැරීමේ යෙදෙන ඔරු ක්ෂිතිජයෙන්, එනම් සැතැපුම් අටක් පමණ දුරකින්, ඔබ්බට යාත්‍රා කරන බවක් නොපෙනේ. ඔරු බිලිබෑමේ උපක්‍රමයත් දැල් එලීමේ උපක්‍රමයත් යන දෙකම භාවිතා කරන අතර පසුව කී උපක්‍රමය යොදනු ලබන්නේ වෙරළාසන්න මුහුදේදීය.

මීගමුවෙන් සංක්‍රමණය වන ඔරු ධීවර කාර්මිකයින් මන්නාරම් මුහුදේ මසුන් මැරීම සිරිතක්ව පැවතිණි. වර්ෂ 1944 දී ඔවුන් හා ප්‍රාදේශීය ධීවරකාර්මිකයින් අතරේ ආරාවුලක් ඇතිවිය. ප්‍රාදේශීය ධීවර කාර්මිකයින්ගේ පැමිණිල්ල වූයේ (ජනවාරියේ සිට පාස්කු කාලය දක්වාත් ජූලි සිට සැප්තැම්බර් දක්වාත් මන්නාරමට සංක්‍රමණය වන්නාවූ) ඔරු ධීවරකාර්මිකයින් මන්නාරම් දූවේ දකුණු වෙරළට සමාන්තරව දිවෙන ගල්පරයෙහි කපොළුවල දැල් එල්ලීමෙන් මාදැල් වලට හසුවෙන මසුන් ප්‍රමාණය අඩුවනසේ කටයුතු කරණ බවය.

1944 ජනවාරි 6 දින ගරු ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා මේ පිළිබඳව කරුණු විභාගකර බැළුවේය. ඔහුගේ තීරණය පහත සඳහන් පරිදි ලේඛන ගතවී ඇත :—

> "මීගමු ධීවර කාර්මිකයින් සම්බන්ධයෙන් ඇමැතිතුමාගේ තීරණය නම්, ඔවුන් වෙරළට ඉතා කිට්ටුවට—සාමාන්‍යයෙන් සැතැපුම් තුනක් ඇතුළතට—නොපැමිණිය යුතු සේත්, බලපත්‍ර නිකුත් කරනු ලැබූ ඔරු ගණන, එනම්—ඔරු 23ක් පමණක්, වාඩි (කොටු) භාවිතා කළ යුතුසේත්, බලපත්‍ර 23ක් මෙම අවුරුද්ද තුළදී නිකුත් කිරීමය. වෙරළේ සිට ඇති දුර ප්‍රමාණය, කාලසීමාව, මසුන් මරණ වේලාවල් සහ ස්ථාන මාරුකිරීම් යනාදියට අදාළ කොන්දේසි වලට යටත්ව උප දිසාපති වරයාගෙන් බලපත්‍රයක් ලබා ගැනීමෙන් තොරව දැල් එලීම, නීති විරෝධී ක්‍රියාවක් වනසේත් මෙයට පෙර නොකඩවාම වාගේ සංක්‍රමණය වූ ධීවර කාර්මිකයින් හට පමණක් බලපත්‍ර නිකුත් කළ හැකිවනසේත් රෙගුලාසි පැනවීම ඇමතිතුමා ආරම්භ කරනවා ඇත. උප දිසාපතිවරයා විසින් එවැනි බලපත්‍ර ඔහුගේ අභිමතය පරිදි ප්‍රාදේශීය ධීවර කාර්මිකයින් හට නිකුත් කළ යුතුය. රෙගුලාසිවල පරමාර්ථය වන්නේ සංක්‍රමණය වන එක් එක් ධීවර කාර්මිකයා විසින් අවුරුදු ගණනාවක කාල සීමාවන් තුළදී අත්කර ගනු ලැබූ භුක්තිය රැකදෙන අතරම ප්‍රාදේශීය ධීවර කාර්මිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීමත්ය. අදහස් වී ඇත්තේ බලපත්‍රවල ගණන එක් වරම සීමා කිරීමත් එම ගණන ඉක්මණින්ම අඩුවී යැමට කටයුතු සැලැස්වීමත් බව පැහැදිලිය. අති විශේෂ අවස්ථාවන් පමණක් සැලකිල්ලට භාජනය කෙරෙතත් බලපත්‍ර නිකුත් කිරීම උදෙසා පියාගෙන් පුතාට පැවරෙන පරම්පරා උරුමය පිළිගනු නොලැබේ."

රෙගුලාසි කෙටුම්පත් කරනු ලැබූ නමුත්, අවශ්‍යතාවයක් ඇති නුවූ නිසාදෝ, ඒවා සම්මත කරගනු නොලැබීය. මෙම දෙපක්ෂයම සහජීවන ගිවිසුමකට එළඹි බව මෙම ආරාවුලෙහිදී ඔරු ධීවර කාර්මිකයින් මීගමුවෙන්ම සංක්‍රමණය වූ යාන්ත්‍රික යාත්‍රා ධීවර කාර්මිකයින්ගේ පැත්ත නොගෙන මන්නාරමේ මාදැල්කරුවන් සමග එකතු වීමෙන්ම පෙනී යයි.

### යාන්ත්‍රික බෝට්ටු

මේවා මෑතකදී ඇරඹුනු පන්න ක්‍රමයකි. යාන්ත්‍රික බෝට්ටු (කුඩාම එක අඩි 26 ක් පමණ දිගය) වලට යාත්‍රා කළ හැකියයි අනුමාන වශයෙන් සිතා ගන්නා දුර ප්‍රමාණය සැතැපුම් 30-35 ක් පමණ වේ. එහෙත් භාවිතයෙහි දී වෙරළේ සිට සැතැපුම් 15 ක් පමණ දුරින් සිට ක්‍රියා කරති. යාන්ත්‍රික බෝට්ටු ද බිලි බෑමේ උපක්‍රමයත් කරමල් දැල් සහ පාවෙන දැල් එලීමේ උපක්‍රමයත් භාවිත කරති. මේවාට ඔරුවලට වඩා ඉක්මණින් එහා මෙහා යා හැකි අතර මේවායේ ගමන් බිමන් කෙරෙහි කාලගුණයේ බලපෑමද අඩුය.

යාන්ත්‍රික බෝට්ටුවකින් ගොඩ දමන සාමාන්‍ය මසුන් ප්‍රමාණය ගණන් බැලීම ඉතා අපහසුය. එක් එක් සාක්ෂිකරුවා විසින් මේ සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රමාණයක වෙනස්වීම් ඇතිව, එනම්, දිනකට අල්ලා ගන්නා මසුන් ප්‍රමාණය රු. 350 හෝ ,සිට රු. 100 ටත් අඩු ගණන් දක්වා වෙනස් වන සේ, කරුණු ඉදිරිපත් කරන ලදී. "පී 22" හි මීගමුවෙන් ගොඩ දමන ලද මසුන් ප්‍රමාණය 1960 දී රාත්තල් 14,00,000 ක් ලෙසත් 1961 දී රාත්තල් 6,00,000 ක් ලෙසත් දැක්වේ. පසුව සඳහන් ගණන සමහර විට අසම්පූර්ණ විය හැකිය. 1960 වේ වර්ෂය සඳහා සංඛ්‍යා වාර්තා මා වෙත නොමැති මුත් 1961 දෙසැම්බර් 13 දිනදී මීගමුවෙහි යාන්ත්‍රික බෝට්ටු 161 ක් තිබුණු බව "පී 27" න් පෙනේ. මේ තොරතුරු පදනම්කරගෙන ගණන් බැළුවහොත් එක් බෝට්ටුවකින් ගොඩ දමන සාමාන්‍ය මසුන් ප්‍රමාණය රාත්තල් 10,000 ක් පමණ වේ. කෙසේ නමුත් මන්නාරමේ එක් "පාඩු"වකින් ලැබෙන මසුන් ප්‍රමාණය ලබා ගැනීම සඳහා බෝට්ටු ගණනාවක්ම අවශ්‍ය වන්නේය.

මගේ ගණන් බැලීම, බෝට්ටු සඳහා ණය දීම පිළිබඳ වූ සාක්ෂිවලින් බොහෝ දුරට තහවුරු වේ. ආම්පන්න වලටත් ඇතුලුව බෝට්ටුවක සම්පූර්ණ වටිනාකම රුපියල් 17,500 ක් පමණ වන අතර ණය මුදලේ ආපසු ගෙවීම මසකට රු. 500ක් පමණ වෙයි. රු. 400ක් පමණ වන මාසික නඩත්තු වියදමට අමතරව මෙම මාසික කොටස් මුදල උපයා ගැනීම බොහෝ දෙනෙකුට අසීරු බව පෙනෙන්නට ඇති හෙයින්දෝ ඔවුහු මාසික කොටස් මුදල් ගෙවීම අතපසු කරති.

මාදැල් එලනු ලබන ජලාශයනට මදක් දියඹින් පිහිටි මුහුදේ යාන්ත්‍රික බෝට්ටු පන්න කිරීමෙන් එතරම් වැඩක් සිදු නොවන බව අමුතුවෙන් කිව යුතු නැත. මෙම කරුණ පිළිබඳව මත භේදයක් නොමැති බවද පෙනේ. මීගමු යාන්ත්‍රික බෝට්ටු ධීවර කාර්මිකයින්ගෙන් කෙනෙකු වන ස්ටැනිස්ලෝස් ප්‍රනාන්දු මහතා, තමා සාමාන්‍යයෙන් පන්න කරන ප්‍රදේශය වෙරළේ සිට සැතපුම් 10ටත් 20ටත් අතර වන බව ප්‍රකාශ කළේය. යාන්ත්‍රික බෝට්ටුවක් එවිට පල ප්‍රයෝජන ලබා ගන්නේ ඔරුවලටවත් යා ගැනීමට අපහසු ජලාශයන් ගෙන් හෙයින්, මෙම ක්‍රියා කලාපය පොදු ප්‍රතිපත්ති අනුව ඉතා යහපත් එකකි.

ධීවර කටයුතු භාර අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය "පී7" හි සඳහන් ය. යාන්ත්‍රික බෝට්ටු නිසා කිසියම් ප්‍රදේශයක දැනට කෙරී ගෙන යන ධීවර කටයුතුවලට බාධාවක් ඇති නොවෙතොත් හෝ එම කටයුතු කෙරෙහි අහිතකර බලපෑමක් ඇති නොකෙරෙතොත් හෝ එම යාන්ත්‍රික බෝට්ටුවලට ඒ ඒ පෙදෙස් වලත් මසුන් ඇල්ලීමේ නිදහස තිබිය යුතුබව ඉන් ප්‍රකාශ කෙරේ. සෑහෙන තරම් ධීවර වරාය වල් ඉදිවෙනතෙක් යාන්ත්‍රික ධීවර බෝට්ටුවලට වෙරළේ ඕනෑම තැනකින් ගොඩඒමට අවසර තිබිය යුතු බවද එහි ප්‍රකාශ වේ. "ඕනෑම තැනකින්" යැයි කියන්නේ "සමහර තැන්වලින්" යැයි මට හැඟේ.

**ගල් පරය :**

ආරාවුලේ තත්ත්වය ඇති සැටියේ දක්වෙන කරුණු ගැන කීමට පෙර, වෙරළින් සැතැපුම් 2½ක සිට 4 දක්වා වූ දුරකින් පිහිටි, මන්නාරම් දූවේ දකුණු වෙරළට සමාන්තරව තාඹු කූඩාහි සිට නැගෙනහිර දෙසට දිවෙන, ගල්පරයක් ගැන පරීක්ෂණයෙහි දී බොහෝ විට සඳහන් වූ බව මා මෙහි සටහන් කළ යුතුය. "පී 2" යොදා ඇති මුහුදු සිතියමේ මෙම පරයේ මීට තවත් දකුණෙන්, මුතු පර පිහිටි පෙදෙසේ පිහිටා ඇති කොටස නම්, ලකුණු කර ඇති නමුත්, මෙම ගල් පරය පෙන්නුම් කර නොමැත.

එසේ වුවත්, මෙවැනි ගල් පරයක් පිහිටා ඇති බවට ඔරු ධීවර කාර්මිකයෙක් වන ලන්සා මහතාත් මන්නාරම් ප්‍රදේශයේ සාක්ෂිකරුවනුත් අතර පොදු එකඟත්වයක් තිබුණි. සම්මාන්විරයෙක් (දැල් හිමියෙක්) වන චෙවලියර් පෙල්දානෝ සාක්ෂි දෙමින් තමා මෙම ගල්පරය පිහිටි ප්‍රදේශයට ගොස් ඇති බවත්, අඩි කිහිපයක ජලයෙන් වැසුණු මෙම ගල් පරය දැක ඇති බවත් කියා සිටියේය. අවසාන වශයෙන් 1944 රේදී ගරු ඩණ්ඩාරනායක මහතා පැවැත්වූ පරීක්ෂණයේ දී පවා (පෙනෙන අන්දමට විරුද්ධත්වයක් නොමැතිව) මෙම ගල්පරය ගැන සඳහන් වූ බවත් තලෙයිමන්නාරමේ සිට සැතැපුම් 10ක් දක්වා ගල්පරය පිහිටා නොමැති බව ධීවර අධ්‍යක්ෂ විසින් පෙන්වා දෙන්නට යෙදුනු බවත් මම සලකා ගනිමි. ධීවර අධ්‍යක්ෂගේ මෙම ප්‍රකාශය, "මෙම ගල්පරය පටන් ගැනෙන්නේ තාඹු කූඩා හි සිටය" යන කියමනක් සමඟ ගැළපේ.

තැන් තැන්වල කපොළු සහිතව මෙම ගල්පරය ඇත්ත වශයෙන්ම පිහිටා ඇතැයි චෙවලියර් පේල්දානෝ කී සාක්ෂිය මම පිළිගනිමි.

**ඔරු ධීවර කාර්මිකයින් සහ මාදැල් කරුවන් අතර ඇති ආරාවුල :**

මා කලින් පෙන්වා දෙන්නට යෙදුණු පරිදි මොවුන් අතරේ ආරාවුලක් නොමැත. ඔරු ධීවර කාර්මිකයින් ඔවුන්ගේම පිළිගැනීම් අනුව මන්නාරම් දූවට දකුණෙන් වූ ගල්පරයේ කපොළු අසළ පන්න කරන බව සැබෑවකි. මේ නිසා වෙරළ කරා ඇදී එන මාළු රැන් වල ගමන් බිමත් කෙරෙහි තරමක බාධාවක් ඇති වන අතර ඔරු ධීවර කාර්මිකයින්වත් පටලවා නොගෙන යාන්ත්‍රික බෝට්ටු නිසා තමන්ගේ පන්න කිරීම්වලට අවහිර පැමිණේ යැයි පැමිණිලි කිරීමට මාදැල් කරුවන් හට පුළුවන් කමක් නොවීය.

සාක්ෂිවලින් සාමාන්‍යයෙන් පෙනී ගියේ 1944 රේ ගිවිසුම තවමත් බලපවත්නා බවත් දෙපක්ෂයම ඒ අනුව ක්‍රියා කරන බවත් ය. ඊටත් වඩා මෙම ගිවිසුම අනුව ඔරු ධීවර කාර්මිකයෝ ක්‍රම ක්‍රමයෙන් වඳවී යන පිරිසක් වෙති.

කරුණු මෙසේ හෙයින්, මෙවකට පවත්නා තත්වය එසේම පවත්වා ගෙන යා යුතු යැයිද දැනට පවත්නා සම්මුතියෙන් යොදා ගත් පිළිවෙළවල් වලට නීත්‍යානුකූල බලයක් ලබාදෙන සේ රෙගුලාසි පැනවීම නොකළ යුතුයැයි ද මම නිර්දේශ කරමි. දැන් පවතින එකමුතුකම කැළඹී යන සේ කටයුතු සැලැස්වීම සංවේග ජනකය. තදබල ගැටීම් හෝ ආරාවුල් ගැන පැන නැගුණහොත් එවිට රෙගුලාසි පැනවීමේ කාලය මතු වන්නේ ය.

**යාන්ත්‍රික බෝට්ටු ධීවර කාර්මිකයින් සහ මාදැල් කරුවන් අතර ඇති ආරාවුල :**

1961 පෙබරවාරි 14 දින හෝ එම වකවානුව තුළදී තලෙයිමන්නාරමේ පරණ පහන් කණුව අසලින් වැල්ලට ආ යන්ත්‍රික බෝට්ටු දහසයක්, සමහර විට දහ අටක්, මීගමුවේ සිට පැමිණීම නිසා මෙම ආරාවුල ඇති විය. ඔරු ධීවර කාර්මිකයන් ඔවුන්ගේ ඔරු නවත්වා තැබූ ප්‍රදේශය මෙය වීම නිසා යාන්ත්‍රික බෝට්ටුවල පැමිණීම අයුක්ති සහගත බලෙන් ඇතුල් වීමක් ලෙස සැලකිණ.

සහකාර අධ්‍යක්ෂ පීටර්ස් මහතා මේ දිනවල මෙම ප්‍රදේශයේ නිල ගමනක යෙදී සිටියෙන් ඔහු විසින් මේ පිළිබඳව පරීක්ෂණයක් කච්චේරියෙහි දී පවත්වනු ලැබීය. ප්‍රාදේශීය ධීවර පරීක්ෂක ගොවින් මහතාගේ සාක්ෂි අනුව, තලෙයිමන්නාරමේ සිට පන්න කිරීමෙන් සාමය කඩාකප්පල් වෙන ලෙස ක්‍රියා නොකරන සේ, දිසාපති, සංක්‍රමණිකයින් කැමති කරවාගෙන ඇත.

මින්පසු මෙම යාන්ත්‍රික බෝට්ටු දැනුම් දීමක් නොමැතිවම මන්නාරම් කලපුවට ඇතුල් වන දොරටුව අසළ පිහිටි "සවුත් බාර්" නමින් හැඳින්වෙන ස්ථානය බලා ගියහ. කලපුවේ බටහිර දොරටුවට සැතපුම් බාගයක් පමණ ඈතින්, මන්නාරමේ සිට වෙරළ කරා වැටී ඇති පාරේ කෙළවරට ඉදිරියෙන්, මෙම බෝට්ටු ගොඩට අදිනු ලැබේ. මන්නාරමේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරියා විසින් ඉදිරිපත් කරනු ලැබූ දළ සිතියම (පී31) අනුව නම් කලින් සඳහන් කෙරුණු දොරටුවට බටහිරින් පිහිටි සැතැපුම් භාගය "පාඩු" බිම් නොවන සේ පෙනී ගියේ ය. එහෙත් දිසාපතිත් සමග පුද්ගලිකව මා මෙම ප්‍රදේශය සෝදිසිකර බැලූ විට "පාඩු" බිම් කලපු දොරටුව තෙක්ම විහිදෙන බව මම දැන ගතිමි. ඇත්ත වශයෙන්ම, කලපු දොරටුව හරහාත් මා දැලක් අදිනවා දුටිමි.

යන්ත්‍රික බෝට්ටු ධීවර කාර්මිකයින් ටික කලක් මෙහි නැවතී සිටි අතර මඩු තැනීම සඳහා රජයේ ඉඩම් පාවිච්චි කලාට ඔවුන් හට තාඹු පවරා දඩ ගසනු ලැබීය.

මෙම කෙටි සම්පිණ්ඩණයෙන් ආරාවුලේ සාමාන්‍ය පසුතලය දක්වේ. වෙරළාසන්න මසුන් මැරීම සඳහා ඉතාමත්ම යෝග්‍ය කාලය ජනවාරි මැද භාගයේ සිට අප්‍රේල් මැද භාගය දක්වා වේ. සංක්‍රමණිකයින් බාධා පමුණුවා අඩු කර ලන්නේ වඩීයේ හොඳම මාළු මඩි යැයි මන්නාරම් මාදැල් කරුවෝ සලකති.

**මා දැල් එලා මසුන් මැරීම් කෙරෙහි බාධා පැමිණවීම :**

යාන්ත්‍රික බෝට්ටු (ඔරු මෙන්ම) කලින් සඳහන් කරන්නට යෙදුණු ගල් පරයේ කපොළු අසළ රැක සිට වෙරළ කරා ඇදී එන මාළු රැන් වලින් මසුන් අල්ලා ගැනීම සඳහා පාවෙන දැල් එලන බවට යම් යම් සාක්ෂි ඉදිරිපත් විය. යාන්ත්‍රික බෝට්ටුවලට ඔරුවලට වඩා වැඩි දැල් පෙළක් ගෙන යා හැකි අතර එවැනි දැල්වලට හසු වන්නේ මාළු අයිනකින් ඉතා සුළු ප්‍රමාණයක් බවටත්, එම දැල් නිසා මාළු අයිනක ඉතිරි කොටස ගල් පරයෙන් සහ මා දැල්වලින් ඈත් වන සේ මසුන්ගේ ගමන් මාර්ගය වෙනස් කෙරෙන බවටත් ඉදිරිපත් වූ සාක්ෂි වලින්, විශේෂයෙන් ආචාර්ය කණගරත්නම් මහතා දුන් සාක්ෂියෙන් මම සෑහීමට පත් වී ඇත්තෙමි. එහෙයින් එවැනි ක්‍රියා ලාභ ප්‍රයෝජන රහිත වූත් නාස්තිකාරී වූත් ඒවා වෙති.

එවැනි බාධා කිරීම් ඇත්ත වශයෙන්ම සිදුවූවා දැයි නිගමනය කිරීම අසීරුය. වැදගත් වනුයේ ප්‍රාදේශීය ධීවර කාර්මිකයින් මෙවැනි අවහිර කම්වල ප්‍රතිඵලය අවබෝධ කරගෙන බියෙන් නැගී සිට විරෝධය ප්‍රකාශ කිරීමයි. මාන්තයි සහ මූසාලි යන (ක්‍රියාකාරී ක්ෂෙත්‍රයෙන් තරමක් ඈතින් පිහිටි) ප්‍රදේශවල ධීවර කාර්මිකයිනුත් මෙයට එක්වී තදබල ලෙස විරෝධය පළ කිරීමේ හේතුව සමහර විට මෙයින් පැහැදිළි වෙනවා ඇත.

යාන්ත්‍රික බෝට්ටු වෙරළින් සැතැපුම් හයක් හෝ ඊට වැඩියෙන් ඔබ්බෙහි පන්න කළ යුතුයැයි, අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිය සිහි තබා ගනිමින්ම, මම සලකමි. මා දැල් සහ ඊට කුඩා දැල් එලන්නන් හට වෙරළේ සිට පළමුවැනි සැතපුම් තුන ඇතුළත වූ ජලාශය ප්‍රයෝජනයට ගැනීමට මෙයින් ඉඩ සැලසේ. ඊළඟට ඇති සැතපුම් තුන තුළ පිහිටි ජලාශය, යම් යම් නියමයන්වලට යටත්ව, ඔරු ධීවර කාර්මිකයින් හට ලබාගත හැකිය. මෙම පිළිවෙල අළුතෙන් යමක් යෝජනා නොකෙරෙන හෙයින් ඔරු සහ යාන්ත්‍රික බෝට්ටු ධීවර කාර්මිකයින් ඔවුනොවුන් පන්න කරන ප්‍රදේශ සම්බන්ධයෙන් දෙනු ලැබූ සාක්ෂි අනුගමනය කරයි.

අවාසනාවකට මෙන්, සැතපුම් තුනක සීමාවෙන් ඔබ්බෙහි මසුන් මැරීම පාලනය කෙරෙන සේ රෙගුලාසි පැනවීමට ධීවර ආඥපනතින් ඉඩ නොසැලසෙන හෙයින් මෙම පිළිවෙළ ක්‍රියාත්මක කරවීමට නීතියෙන් අවසර නැත. එහෙයින් මම මෙම නිර්දේශයන් ඉදිරිපත් කරමි—

(1) මෙරට සතු මුහුදු ප්‍රදේශයේ සීමාවන් වෙරළේ සිට සැතපුම් හයක් දක්වා පුළුල් කිරීමේ යෝග්‍යතාවය ගැන ඇමති තුමා සලකා බැලිය යුතුය.

(2) මන්නාරම, මාන්තායි සහ මූසාලී යන ආදායම් පාලක නිලධාරීන්ගේ කොට්ඨාශවල වෙරළට යාබදව පිහිටි දැනට පවත්නා මෙරට සතු මුහුදු ප්‍රදේශයෙහි යාන්ත්‍රික බෝට්ටු විසින් මොනම අන්දමේ මසුන් මැරීමක් වත් කිරීම තහනම් කළ යුතුය.

(3) ඉහත කී ප්‍රදේශවල මුහුදු වෙරළේ සිට සැතැපුම් හයක් ඇතුළත මසුන් නොමරන ලෙස යාන්ත්‍රික බෝට්ටු හිමියන්ගෙන් ඉල්ලා සිටිය යුතු අතර මෙම ඉල්ලීම කඩ කරන අයවළුන් හට ගොඩ බැසීමේ හෝ වෙනත් පහසුකම් රජයෙන් ලබා නොදිය යුතුය.

**මසුන් ගොඩබෑමේ පිළියෙළවල් යෙදීම :**

මගේ පරීක්ෂණයෙහි විභාග කිරීම සඳහා මට පවරන ලද කරුණු මූලික වශයෙන් ම බාධා කිරීම් වලට අදාල වෙතත් "මෙම ආරාවුල නිසා පැන නගින, සඳහන් කරුනු ලබන්නා වූ සියළුම කරුණු" පිළිබඳවත් වාර්තා කිරීම මා හට පැවරී ඇත. එහෙයින්, බෝට්ටු නැංගුරම් හෙළන ස්ථාන සහ මසුන් ගොඩ බෑම පිළිබඳව නිරීක්ෂණ කිහිපයක් ඉදිරිපත් කිරීම මගේ යුතුකමක් වී ඇත.

මන්නාරම් දිස්ත්‍රික්කයේ මුහුදු බඩ ප්‍රදේශයන් වටා පන්න කිරීමේදී යාන්ත්‍රික බෝට්ටු පිළිපැදිය යුතුයැයි මා සලකන කොන්දේසි දැනටමත් මෙහි ඉහතින් සඳහන් කර ඇත. 1961 දී ඇරඹුණු මෙම මුල් ගමන පුරුද්දක් වශයෙන් ස්ථිර වීමට පෙර මේ පිළිබඳව ස්ථිර ප්‍රතිපත්ති සම්මත කර ගැනීම යහපත් වන්නේය. සම්මුති නීතිය පිට ඇති අයිතිවාසිකම් හිමි වූ පලියටම "අවුලෙන් අවුල්" ඇති කිරීමට ඔවුනට ඉඩ ලැබෙතැයි සංක්‍රමණික ධීවර කාර්මිකයින් බලාපොරොත්තු විය යුතු නැත. එහෙත් ඔවුන් සංක්‍රමණය වන ප්‍රදේශයන්හිදී යුක්ති සහගත ලෙස සැලකුම් ලැබීමට ඔවුනට අයිතිවාසිකමක් ඇත.

වෙන වචන වලින් කියතොත්, ගොඩ බැසීම සඳහා සුදුසු තැනක් සලස්වා නොදෙනවානම් මන්නාරම් දිස්ත්‍රික්කය වටා පන්න කිරීමට මීගමු සංක්‍රමණිකයින්හට අවසර දීමේ තේරුමක් නැත. යාන්ත්‍රික බෝට්ටු ක්‍රියා කරවිය හැකි ප්‍රදේශය සීමාසහිත වන අතර ඒවාහට මසුන් සීතකර තැබීමේ සහ ආරක්ෂා කර තැබීමේ පහසුකම් නො මැත. එහෙයින්, තාවකාලික "වරායවල්" මන්නාරම් දූවෙහි දකුණු වෙරළේ හෝ බස්නාහිර තුඩුවේ හෝ සොයා ගත යුතුව ඇත.

කාර්මිකව සලකා බැලීමේදී කළහැකි යැයි හැඟුණත්, "පාඩු" බිම් අතරේ යාන්ත්‍රික බෝට්ටු ගොඩ බැස්වීම කළ නොහැකිය. එවැනි ක්‍රියා මාර්ගයක් සාමකාමීව ක්‍රියාත්මක කළ නොහැකි අතර එවැන්නක් තදබල ලෙසම තුරුස්සනු ලබනවා ඇත. ගොඩ ඇදීම හෝ නැංගුරම් ලෑම කළ හැකි ස්ථානයන් ලෙස සඳහන් කරනු ලැබුවේ තලෙයිමන්නාරමේ පරණ පහන් කණුව අසළ ස්ථානය සහ "සවුත් බාර්" නමින් හැඳින්වෙන ස්ථානය පමණකි. අහේතුවකට මෙන් මේ පිළිබඳව කාර්මික සාක්ෂි කිසිවක් පරීක්ෂණයේ දී ඉදිරිපත් නොවුණු අතර, මට දැන ගන්නට ලැබුණු අන්දමට නම්, ධීවර දෙපාර්තමේන්තුවෙන් ද ලබා ගත නොහැක.

තලෙයිමන්නාරමේ පරණ පහන් කණුව අසළ වෙරළ මම පුද්ගලිකව සෝදිසි කර බැලුවෙමි. එහෙත් පහත දැක්වෙන හේතූන් නිසා එය පාවිච්චියට ගැනීම මට නිර්දේශ කළ නොහැකිය :—

(1) ලබාගත හැකි රජයේ ඉඩම් සියල්ලම ධීවර කාර්මිකයින්ගේ මඩු තැනීම සඳහා බෙදා දී ඇති අතර ප්‍රදේශයේ නිවැසි අය ඔවුන්ගේ ඉඩම් දීමට කැමති නොවනවා ඇත.

(2) ඔරු නවත්වා තැබීම සඳහා මෙම ස්ථානය දැනටමත් පාවිච්චි කරනු ලැබීම.

(3) මෙය ඉතා දුරබැහැර වූත් මුරභාරයේ තබා ගැනීමට අසීරු වූත් ස්ථානයක් වීම සහ ඉන්දියාවට නුදුරෙන් පිහිටීම හා අන්තර්ජාතික ගමනාගමන හමුවේ මෙය ඉතා වැදගත් කරුණක් වීම.

මෙකී හේතූන් නිසා මෙම ස්ථානය සුදුසු නොවන බව පෙනී යයි. එහෙත් මා විරුද්ධව දක්වූ කරුණු මඟහැරවිය හැකි වේ නම් එය පාවිච්චි නොකිරීමට අන් හේතුවක් නැත. මෙම ස්ථානයට විරුද්ධව මා දක්වූ කරුණු කිසිවක් "සවුත් බාර්" නමැති ස්ථානය කෙරෙහි බල පානු නොලැබේ. මෙහි ලා, "සවුත් බාර්" නමින් හැඳින්වෙන වැලිකණ්ඩියේ දෙපැත්තෙහි පිහිටි වෙරළ, මම අදහස් නො කරමි. එය "පාඩු" බිම් වන අතර බෝට්ටුවලට පාවිච්චියට ගත නොහැක. ඇත්ත වශයෙන් ම මා අදහස් කරන්නේ මුහුදට දොරටු දෙකක් එනම් දැනටමත් මෙහි ඉහත සඳන් කෙරුණු බස්නාහිර දොරටුවත්, නැගෙනහිර දෙසින් පිහිටි තවත් දොරටුවකුත් ඇති මන්නාරම් කලපු ජලාශයයි. මෙම දොරටු දෙක සහ නගරය අතර ඇත්තේ දුම්රිය පළට ඉතා නුදුරින්ම පිහිටි දුම්රිය පාලමයි. දුම්රිය පාලමට බටහිරින් දුම්රිය පාර දෙපැත්තේම මසුන් මරන්නන්ගේ කඳවුරක් ලෙස භාවිතා කළ හැකි පාවිච්චියකට ගනු නොලැබූ සමතලා රජයේ ඉඩම් තීරු දිගටම ඇත. මෙම ස්ථානයට යාගත හැකි නියම පාරක් නොමැති මුත් වෑන් රථයකට එහි යා හැක.

පාලම අසළ ජලය සැලකිය යුතු තරම් ගැඹුරුය. ඔරුවකින් එතැනින් ගිය අයෙක් එය බඹ දෙකක් ගැඹුරු යැයි පැවසුවේය. සැලකිය යුතු එකම කාරණය නම් මුහුදේ සිට දුම්රිය පාලම තෙක් පැමිණීමට සුදුසු (දිය) පාරක් සොයා ගැනීමයි. එය තරමක් අසීරු කරුණකි.

නැගෙනහිර දොරටුව හරහා දුම්රිය පාලම යටින් ගලා යන දිය අගලක් අඟලේ සිතියම පෙන්නුම් කරයි. එහෙත් අඩි 4-5 ක වතුරක් අවශ්‍ය යාන්ත්‍රික බෝට්ටුවලට මෙය පාවිච්චි කිරීමේ දුෂ්කරතා ඇතිවිය හැකියි. එක් හේතුවක් නම් පෙදෙස් වැසියනගේ මතය අනුව මෙය මඩවලින් පිරී ඇතිවීමයි. අනෙක් හේතුවක් නම් මේ වර්ෂයේදී වැලි කණ්ඩිය වෙන අවුරුදුවලදී තරම් සම්පූර්ණ ලෙස සෝදා ගොස් නොතිබීමයි.

අනෙක් දොරටුව රවුම් (දිය) පාරකින් පාලමේ අනෙක් පැත්තට යා වේ. සම්පූර්ණ වඩදිය අවස්ථාවේදී මෙම (දිය) පාරෙන් යාන්ත්‍රික බෝට්ටු යාත්‍රා කරවිය හැකි බව පෙනී යයි.

මා සඳහන් කරන ස්ථානය පාවිච්චියට ගැනීමේ හැකියාවන් ගැන මිම්මක් ගැනීම එතරම් නිවැරදිව කළ හැකි නොවේ. ක්‍රියාත්මක කරවිය හැකි අන්දමේ විසඳුමක් ලබා දීමට එය අපොහොසත් වේ නම් හෝ අන් තැනක් සොයා ගත නො හැකි වේ නම් හෝ මීගමු සංක්‍රමණය නැවැත්වීම හැර වෙන කළ හැකි අන් කිසිවක් මට නො පෙනේ. මෙම කරුණෙහිදී මම මීගමුවේ ධීවර කාර්මිකයින් කෙරෙහි තදින්ම අනුකම්පා කරමි. ඔවුහු ව්‍යාපාරික ධෛර්ය සම්පන්න බවක් සහ නිර්භීත ක්‍රියා ශූරත්වයක් දැක්වූවෝ වෙති. ඔවුන්ගේ පරමාර්ථයන් ඉටුකර ගැනීමට ඔවුන්හට නොලැබෙතොත් ඒ ඔවුන්ගේ අහේතුවට පවත්නා භූ විෂමතාලක්ෂණයන් නිසා පමණකි. කඳවුරක් ගොඩ නැංවිය හැකි ස්ථානය කරා යාත්‍රා ගමන් කරවිය හැකි (දිය) පාරක් හැකි පමණ ඉක්මණින් ම තනා දීමට සලකා බැලීම හෝ වෙනත් සුදුසු ධීවර වරායවල් සපයා දීම හෝ රජය විසින් කළ යුතුව ඇත. එහෙයින් මම පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් කරමි :—

(1) දකුණු වෙරළේ මන්නාරම් කලපුවට ඇති, දොරටු දෙක හරහා යාත්‍රා ගමන් කරවිය හැකි ඇළවල් හා අගල්වලත් මාදැල් එලීම සහ වෙනත් පන්න ක්‍රම යෙදීම තහනම් කෙරෙන සේ රෙගුලාසි පැනවිය යුතුය.

(2) මන්නාරමට නුදුරින් පිහිටි දුම්රිය පාළමේ ඉවුර දෙපැත්තේම පිහිටි ඉඩම් මසුන් මරන්නන්ගේ කඳවුරක් සඳහා වෙන් කර තැබිය යුතුය.

(3) මුහුදේ සිට දොරටු දෙකෙන්ම පාලම කරා ළඟාවිය හැකිදැයි සොයා බැලීමට අවශ්‍ය පියවර වහාම ගත යුතුය. බෝට්ටුවලට පාලම අසළ නැංගුරම් ලීමට පුළුවන.

(4) මෙම කාරණය පිළිබඳව අත්හදා බැලීම සඳහා මීගමුවෙන් යාන්ත්‍රික බෝට්ටු හිමියන් දෙතුන් දෙනෙකුට ඇරයුම් කළ යුතුය.

(5) අත්හදා බැලීම සාර්ථක වෙතොත්, යෝජිත කඳවුරු බිමේ සිට, දිසාපති විසින් නියම කරනු ලබන කාල සීමාවන් තුළ, පන්න කිරීම සඳහා බෝට්ටු විස්සකට බලපත්‍ර නිකුත් කළ යුතුය.

(6) අත්හදා බැලීම අසාර්ථක වුවහොත් මෙම වර්ෂයේදී මන්නාරම් වෙරළේ බෝට්ටු ගොඩ ඇදීමට සංක්‍රමණිකයින්හට අවසර නොදී, 1963 දී වත් සංක්‍රමණිකයින්හට පන්න කිරීමට ඉඩ සැලසෙන සේ, හැකිනම්, පාලම දක්වා අගලක් කැපීමට අවශ්‍ය පියවර වහාම ගත යුතුය.

(7) මන්නාරම් කලපුව හැර, නැංගුරම් ලීමට හෝ බෝට්ටු ගොඩ ඇදීමට හෝ සුදුසු වෙනත් ස්ථානයක් සොයා ගනු ලැබුව හොත් බලපත්‍ර පිට එම ස්ථානය පාවිච්චි කිරීමට සංක්‍රමණික ධීවර කාර්මිකයින් හට අවසර දිය යුතුය.

(8) ධීවර දෙපාර්තමේන්තුව වෙරළත් වෙරළාසන්න මුහුදත් සමීක්ෂණය කර, මන්නාරම් දිස්ත්‍රික්කයේ සිට ලාභ ප්‍රයෝජන සහිතව ක්‍රියා කාරී විය හැකි යාන්ත්‍රික බෝට්ටු ගණන, ගණන් බැලීමට සහ එම බෝට්ටු නැවැත්විය හැකි වරායවල් පිහිටුවීමට තැත් කළයුතුය.

(9) මාදැල් එලනු ලබන සීමාවන්ගෙන් ඔබ්බෙහි වූ ජලාශයන් ඔවුනටත් ප්‍රයෝජනයට ගත හැකි වනසේ යාන්ත්‍රික බෝට්ටු පාවිච්චි කිරීමට මන්නාරම් වැසියන් හටත් අනුබල දිය යුතුය.

මගේ නිර්දේශයන් මට ඉදිරිපත් කළ හැකි හොඳම ඒවායි. එහෙත් හේතූන් කිහිපයක්ම නිසා සම්පූර්ණ ප්‍රශ්නයම ඒවායින් මුළුමණින්ම නොවිසඳේ—

(1) මෙම ප්‍රශ්ණය දීර්ඝ කාලීන එකකි.

(2) යාන්ත්‍රික බෝට්ටුවල ව්‍යාප්තිය ඊට සැසඳෙන වරාය පහසුකම් සැපයීමේ දියුණුවක් නොමැතිවම පැතිරගොස් ඇත. (මීගමුවෙහි නම් වරාය පහසුකම් එවකටත් පැවති නිසා අපහසුකම් පැන නොනගියි).

(3) වෙරළාසන්න මුහුදේ තත්වය පිළිබඳව කාර්මික සාක්ෂි ලබා ගත නොහැකි වීය.

මගේ විසඳුම මා ඉදිරිපත් කරන්නේ මෙම වාර්තාව පදනම් කර ගත ස්ථිර විසඳුමක් සොයා ගන්නා තෙක්, තාවකාලික පිළියමක් ලෙසටය. සංක්‍රමණික ධීවර කාර්මිකයින්හට වරාය පහසුකම් සැපයිය යුතුය, යන්න ගැන, ප්‍රතිපත්ති වලද සඳහන් හෙයින්, සැකයක් ඇති නොවේ. යම් හෙයකින් එම පහසුකම් නොපවතීනම් ඒවා සපයා දිය යුතුය. එහෙත් සංක්‍රමණය වීම ඉතා මෑතකදී ඇරඹුණු එකක් හෙයින්, මනාසේ දියුණු වී ඇති ප්‍රාදේශීක කර්මාන්තයක් අවුල් කර දැමීමට හෝ, ලංකාවට හිතකර සේ සෑම අන්දමකම මසුන් මැරීමේ ක්‍රම එකිනෙකත් සමඟ එක්ව පවතින්නාවූ ස්ථිර පිළිවෙලක් යොදා ගැනීමෙහිදී හානිකර වන අවිචාර හැඟීමක් ඇති කරවීමට හෝ, ඊට අවසර නොදීම ඉතා වැදගත්ය.

දෙපක්ෂයම ටිකක් පාඩු විඳීමට කැමති කරවාගෙන මෙම ආරාවුල බේරුම් කිරීමට මම බලාපොරොත්තු වූයෙමි. ප්‍රදේශීය ධීවර කාර්මිකයින් වෙනුවෙන් පෙනී සිටි නීතිඥයෝ විසඳිය යුතු ප්‍රශ්න සහ පිළිගැනීම් අනුව ක්‍රියාකිරීමට යෝජනා කළහ. එහෙත් සංක්‍රමණික ධීවර කාර්මිකයින් වෙනුවෙන් පෙනී සිටි නීතිඥයින් හට එය පිළිගත නොහැකි විය. මෙම ක්‍රියා මාර්ගය අනුගමනය කළ යුතුමයැයි බලකර සිටීමට මට අයිතිවාසිකමක් ඇතැයි නොහැඟිනි. උසාවියක මෙන් (නියමිත චාරිත්‍ර විධි සම්පූර්ණයෙන්ම අනුගමනය නොකෙරුණත්) සාක්ෂි සටහන් කර ගන්නා ලදී. මෙහි ප්‍රතිඵලය වූයේ අවසාන නිර්දේශයන් ඉදිරිපත් කිරීම මගේම වගකීමක් වීමය. මට සිතෙන හැටියට, එම නිර්දේශයන් දෙපක්ෂයටම සතුටුදායක නොවෙනවා විය හැකිය. එහෙත් යුක්තිය ඉෂ්ටකර දීමට සහ රජයේ ප්‍රතිපත්ති අනුගමනය කිරීමට හැකි තරම් දුරට මම උත්සාහ කෙළෙමි.

මා ස්තුතිවන්ත විය යුතු අය බොහෝ ය. නීතිය සවිස්තරව විභාග කර බැලීමේදීත් උචිත කාරණා කෙරෙහි අවධානය යොමු කිරීමේදීත් මහෝපකාරී වූ උගත් නීතිඥයින්, සාක්ෂි දුන් රජයේ සේවකයින් සහ පොදු පුරවැසියන්, ධීවර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පුද්ගලිකව පැවැත්වූ සෝදිසි කිරීම්වලදී මා කැටුව ගිය මත්නාරම් දිසාපති, අන්තිමට කීවත් අගයෙන් අඩු නොවන්නා වූ, ඉතා කාර්යක්ෂමතාවයකින් සහ මනා සුහදතාවයකින් සේවය කළ ලඝු ලේඛකයින් සහ භාෂණ පරිවර්තකයින් ඔවුන් අතර වෙති.

අවසාන වශයෙන්, සංක්‍රමණය වන කාලසීමාව දැනටමත් ඇරඹී ඇති බව මා සඳහන් කළ යුතුය. මීගමු සංක්‍රමණිකයින්, මෙම වාර්තාව පිළියෙළ වන තෙක්, ක්‍රියා කිරීම් අත්හිටවීමට එකඟ වූහ. එහෙයින් අමාත්‍යාංශ මගින් ගත යුතු නිසි පියවර ගැනීම් නොපමාව ම කිරීම අවශ්‍ය වන්නේ ය.

ඩබ්ලිව්. ජේ. ඒ. වැන් ලැන්ගන්බර්ග්,
කොමසාරිස්.

1962. 2. 5,

පෙ. ව. 10.00 ට කියවන ලදී.

කැමැත්තෙන් මෙය සිංහලයෙන් නොකියවන ලදී. එහෙත් කැමැත්ත අනුව මෙහි සාරාංශයක් දෙමළට පරිවර්තනය කරන ලදී.

කේ. ඇන්. චොක්සි මහතා සහ එප්. වන්නිතම්බි මහතා ප්‍රාදේශීය ධීවර කාර්මිකයින් වෙනුවෙන් සහ

පී. බී. පී. ද සිල්වා මහතා සංක්‍රමණික ධීවර කාර්මිකයින් වෙනුවෙන් පෙනී සිටියහ.

6-257

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### මහනුවර ආරෝග්‍යශාලා මණ්ඩලය

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පණතේ 11 වෙනි වගන්තිය යටතේ 1962 මැයි මස 29 වෙනි දින පටන් 1962 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා සමාදාන විනිශ්චයකාර තැන්පත් සී. පී. දුනුවිල දිසාව මහතා, මහනුවර ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ.

එල්. එස්. බී. පෙරේරා.
ස්ථිර ලේකම්.

1962 මැයි මස 29 වෙනි දින,
කොළඹ සෞඛ්‍ය අමාත්‍යංශයේ දීය.

6-417

---

## 1953 අංක 36 දරණ රබර් නැවත වගා කිරීමට ආධාරදීමේ පණත

### නිවේදනයයි

1953 අංක 36 දරණ රබර් නැවත වගා කිරීමට ආධාර දීමේ පණතේ 10 වැනි ඡේදය යටතේ ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති තුමා විසින් 1962 මැයි 30 දින සිට 1962 සැප්තැම්බර් 30 වැනි දින දක්වා රබර් නැවත වගා කිරීමේ උපදේශක මණ්ඩලයේ සාමාජිකකයකු වශයෙන් එම්. ඩබ්ලිව්. තොම්ප්සන් මහතා පත්කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. ජී. ඇල්. මිසෝ,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල
අමාත්‍යාංශයේ නිත්‍ය ලේකම්.

1962 මැයි 30 වැනි දින,
කොළඹ, මහ ලේකම් ගොඩනැගිල්ලේ දීය.

6-325

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

කොළඹ 2, 62.5.24.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ අංක 735 දරණ මහ පසියාගල ගම්මුලාදැනි වසමේ පිහිටි මහගෙදර වත්ත නැමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 5 ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : ඉස්කාගාර වත්ත සහ අම්බේ; නැගෙනහිරට : වසම්බු කුලියවත්ත සහ සෙන්දන්පෙරුම වත්ත; දකුණට : උතුරු පසියාගල දුම්රියපළ පාර; බස්නාහිරට : දුම්රිය පාර.

6-361

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

මගේ අංකය : ඩීබී/රා/48.

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයන් යටතේ අංක 401 දරණ ජාතික නිවාස පනතේ 76 වැනි ඡේදය අනුව උකස් කරනු ලබූ ඉඩම් විකිනීම සඳහා බලය දීම

ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයන් යටතේ අංක 401 දරණ ජාතික නිවාස ආඥාපනතේ අංක 9 (1) (බී) දරණ වගන්තිය යටතේ පත් කරනු ලැබූ ජාතික නිවාස සහකාර කොමසාරිස් තැන්පත් ධනපාල සිරිසේන වීරසිංහ වන මම, ලංකාණ්ඩුව සඳහා සහ වෙනුවෙන් ක්‍රියා කරමින් කොළඹ ටී. ටී. බී. මාතලන්ද ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද 1955 නොවැම්බර් 21 දින අංක 473 දරණ උකස්කරය යටතේ මුදල් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ප්‍රථම යෙන් මොරටුවේ රාවතාවත්තේ ගාලු පාරේ අංක 278 දරන ස්ථානයේ පදිංචිව සිටි දැනට මොරටුවේ රාවතාවත්තේ ධම්රත්න මාවතේ අංක 11/13 දරන ස්ථානයේ පදිංචි වර්ණකුලසූරිය පෝල් තාමෙල් ගෙන් 1961 ඔක්තෝබර් 31 දින තෙක් ආයවිය යුතු රුපියල් විසි එක් දහස් දෙසිය තුනයි ශත විසිදෙකක් (රු. 21,203.22) අයකර ගැනීම සඳහාත්, එසේම 1961 ඔක්තෝබර් 31 දින සිට විකිණීම පැවැත් වෙන දිනය හෝ සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා තවදුරටත් වූ රුපියල් පහළොස් දහස් තුන්සිය පනස් තුනයි ශත දහය (රු. 15,353.10) ක මුදලක් සම්බන්ධයෙන් එන පොළී මුදල වර්ෂයකට සියයට තුන්හමාරේ (3½) ප්‍රමාණයට යථෝක්ත උකස්කර ප්‍රකාර 1961 ඔක්තෝබර් 31 දින සිට විකිණීමේ දිනය තෙක් එකතු වන සියළුම දඩ මුදල් සමග අයකර ගැනීමත්, එසේ අයකර ගැනීමේදී දැරීමට සිදුවන වියදම් සහ ගාස්තු අයකර ගැනීම සඳහාත්, මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ඉඩම සහ එයට අදාල සියළු දේත් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිණිස ආඥා නිකුත් කර එසේ විකිණීම සඳහා කෝට්ටේ, පිටකෝට්ටේ, බැද්දෙගාන පාරේ අංක 62 දරන ස්ථානයේ සිවලී බී. කේ. ඒකනායක, ප්‍රසිද්ධ වෙන්දේසිකරුට බලය දෙමි.

ධනපාල වීරසිංහ,
ජාතික නිවාස සහකාර කොමසාරිස් තැන.

1962 මැයි 24 දින,
කොළඹ 2.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව පළාත් ආණ්ඩු සභා සීමාව තුළ පිහිටි, දැනට රාවතාවත්තේ ධම්රත්න මාවතේ වරිපනම් අංක 13/11 දරන කොළඹ ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ අංක එම්. 502/29 යටතේ ලියා පදිංචි කර ඇති; උතුරින් වික්ටර් ඇලෙක්සැන්ඩර් ධම්රත්නට අයිති "බී" දරන ඉඩම් කොටසද, නැගෙනහිරින් ධම්රත්න පටුමගද, දකුණින් ලුවිස් ධම්රත්නට අයිති දේපොලද, බස්නාහිරින් පී. සී. ප්‍රනාන්දුගේ උරුමක්කාරයින්ට අයිති දේපොල ද, මායිමව පිහිටා ඇති 1930 පෙබරවාරි 8 දින ඒ. එච්. ප්‍රනාන්දු අවසර ලත් මිනින්දෝරු තැන විසින් සකස් කරන ලද අංක 1213 දරන මාණික සැලැස්ම පරිදි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහසයයි දශම හතරයි දෙකක් (අ. 0, රූ. 1, ප. 16.42) වූ ඉහතකී අංක 1231 දරන මාණික සැලැස්මේ "සී" සලකුණු කර ඇති, මාදන් ගහවත්ත නමැති ඉඩමේ, සාදන ලද ගෙයක් සහිත ඉඩම් කොටසක් වේ.

6-459.

---

## අංක 17/62 දරන ආනයන පාලන දැන්වීම

### ජ්යාරූප සේයා පටි, සේයා කොළ හා සේයා ප්ලේට් ආනයන

1961 ජනවාරි 25 වෙනි දින අංක 2/61, 1961 ජූලි 10 වෙනි දින අංක 26/61 හා 1962 මාර්තු 24 වෙනි දින අංක 7/62 දරන ආනයන පාලන දැන්වීම් කෙරෙහි ආනයනකයන්ගේ අවධානය යොමු කෙරේ.

2. 1958, 1959 හා 1960 යන වර්ෂ තුළ ආනයනය කර ඇති ජ්යාරූප සේයා පටි, සේයා කොළ හා සේයා ප්ලේට් පිළිබඳ ලේඛනයක් මෙම පාලනයට ඉදිරිපත් කිරීමට ආනයනකයන් වෙත මෙයින්

දන්වනු ලැබේ. (1) රේගු සටහන් අංකය හා දිනය, (2) යාත්‍රාවේ නම හා සපැමිණි දිනය, (3) නිෂ්පාදිත රට, (4) ප්‍රමාණය හා (5) රක්ෂණ නැව් ගාස්තු ඇතුළු වටිනාකම රුපියල් යන කරුණු එම ලේඛනයට ඇතුළත් විය යුතු අතර රේගු මුද්‍රා සටහන් හා ඉන්වොයිසි ද ඇතුළත් විය යුතුය.

3. ඇක්ස්රේ පට, ලිතෝ පට, මුද්‍රණ වැඩ සඳහා සකස් කළ ප්ලේට්ස් හා සිනමා පට ආනයන ප්‍රමාණයන් මෙම ලේඛනයට ඇතුළත් විය යුතු නොවේ. එමෙන්ම, රජය සඳහා වූ යම් ආනයනයක් වෙතොත් එයද මෙයින් ඉවත් විය යුතුය.

4. මෙම ලේඛනයට ආනයනකයා විසින් සත්‍ය බවටත්, නිවැරදි බවටත් සහතික කළ යුතු අතර එය මෙම දැන්වීම ගැසට් පතෙහි පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මෙම පාලනයට ඉදිරිපත් කළ යුතු වේ. යම් වැරදි ප්‍රකාශයක් කර ඇති බැව් ඒත්තු ගියොත් තමාට හිමිවන ආනයන කොටස දීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සී. මයිල්වාගනම්,
ආනයන හා අපනයන පාලක.

1962 ජූනි මස 1 වැනි දින,
කොළඹදීය.

6-447

---

## 1938 අංක 51 දරණ සමාගම් ආඥාපනත

### 277 (5) වගන්තිය යටතේ සීමාසහිත ආර්. ඊ. ඊ. (සිලෝන්) නම කපා හැරීමේ දැන්වීම

1938 අංක 51 දරණ සමාගම් ආඥාපනතේ විධි විධාන යටතේ 1947.3.7 දින සංස්ථාපිත සමාගමක් වන සීමාසහිත ආර්. ඊ. ඊ. (සිලෝන්) ව්‍යාපාරික කටයුතුවල නිරත වී නැති බව, නොහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින් ද,

එසේ නොකිරීමට හේතු නොදක්වුවහොත්, එදින සිට තුන් මාසයක් ඉකුත් වූ විට, සීමාසහිත ආර්. ඊ. ඊ. (සිලෝන්) නම රෙජිස්ටරයෙන් කපා හරින බවට 1961.12.22 දින අංක 12,833 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන්, 1961.12.13 දින දරණ දැන්වීමක් පළ කරන ලද හෙයින් ද,

සීමාසහිත ආර්. ඊ. ඊ. (සිලෝන්) ඉහත කී තුන් මාසයේ කාල සීමාව තුළ එසේ නොකිරීමට හේතු දක්වා නොමැති බැවින් ද,

අද දින, සීමාසහිත ආර්. ඊ. ඊ. (සිලෝන්) නම සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින ලද බව ද, ඉහත කී සමාගම විසුරුවා හරින ලද බව ද, වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් වෝල්ටර් මහේස සෙල්ලයියා වන මම, 1938 අංක 51 දරණ සමාගම් ආඥාපනතේ 277 (5) වැනි වගන්තිය යටතේ, මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. ඇම්. සෙල්ලයියා,
වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර්.

6-330

---

අංකය : ජේ. 646.

## වෙළෙඳ සමාගම් ආඥාපනත

### 227 (4) වැනි වගන්තිය යටතේ "සීමාසහිත ද කොතලාවල එස්ටේට්" සමාගම විසුරුවා හැරීමේ දැන්වීම

### සාමාජිකයින්ගේ ඉච්ඡානුග ඈවර කිරීම

ඈවර කැරෙමින් පවත්නා සීමාසහිත ද කොතලාවල එස්ටේට් සමාගමේ අවසාන නිමා කිරීමේ රැස්වීමේ වාර්තාව හා සමග ඈවර කරුවන්ගේ ගිණුමේ පිටපතක් ලැබ 1962 මැයි 29 වැනි දින, ලියාපදිංචි කරන ලද හෙයින්.

යථොක්ත දින සිට තෙමසක් ඉකුත් වූ පසු සීමාසහිත ද කොතලාවල එස්ටේට් සමාගම වෙළෙඳ සමාගම් ආඥාපනතේ 227 (4) වැනි වගන්තියේ විධිවිධාන යටතේ විසුරුවා හරින ලද සේ සැලකෙන බව දැන ගනිත්වා.

ඩබ්ලිව්. ඇම්. සෙල්ලයියා,
වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර්.

1962 මැයි 30 වැනි දින,
කොළඹ 1,
වෙළෙඳ සමාගම් ලියාපදිංචි කිරීමේ
දෙපාර්තමේන්තුවේදී ය.

6-360

---

## දැන්වීමයි.

වයඹ පළාතේ හලාවත දිස්ත්‍රික්කයේ පිටිගල් කෝරළේ උතුර කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ගල්මුරුව ගම්පතී කොට්ඨාශයේ ගවයින් අතර, "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැව් 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වෂී 1962 මාර්තු 23 දින අංක 12,993 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී.

1962 මැයි 31 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
කාර්යාලයේදී ය.

6-403

---

## ප්‍රකාශනයයි

මැද පළාතේ නුවර එළිය දිස්ත්‍රික්කයේ නිල්දන්දහින්න කලාගම් වත්ත සහ අඹන් ඇල්ල ගම්වල ගවයන් අතර "හෙමරජික් සෙප්ටිසීමියා" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආරියදාස අමරසිංහ වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි:—

උතුරට: වැදුරු කෝරළේ, බටහිර ගම්පහ කෝරළේ, නැගෙනහිර ගම්පහ කෝරළේ සහ කන්දපල්ල කෝරළේ ; දකුණට: කන්දපල්ල කෝරළේ සහ තල්පිටි ගම්පත්තුව ; නැගෙනහිරට: වියලුම කෝරළේ, ගම්පහ කෝරළේ, මැදපළාත කෝරළේ යටි පළාත කෝරළේ, උඩපළාත කෝරළේ සහ දඹවින්න පත්තු කෝරළේ ; බස්නාහිරට: අඹගමුව කෝරළේ, දිඹුල කෝරළේ, උඩපනේ කෝරළේ, කොහකේ කෝරළේ සහ ගංගා පළාත කෝරළේ.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර නුවර එළිය පශු වෛද්‍ය තැනගෙන් හෝ වලපනේ කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතු යි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 මැයි 28 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කාර්යාලයේ දීය.

6-329

---

## වන්දනා ගමන් ආඥා පනත

1960 ජූනි මස 3 වැනි දින, අංක 12,139 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ද, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ ද, පළ කරන ලද ප්‍රකාශයෙන් සංශෝධිත වන්දනා ගමන් ආඥා පනත (139 වැනි පරිච්ඡේදය) යටතේ, අනුරාධපුර පූජනීය නගරය හා මිහින්තලේ සම්බන්ධව පනවන ලද රෙගුලාසිවල, 3 වැනි රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි.

1962 පොසොන් වන්දනා වාරය 1962 ජූනි මස 15 වැනි දින ආරම්භ වී 1962 ජූනි මස 20 වැනි දින අවසන් වන බව, සාමාන්‍ය දැනගැනීම සඳහා මෙයින් දැනුම් දෙමි.

නිශ්ශංක විජයරත්න,
අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සභාපති.

6-303

## රථවාහනවලට අවහිර

දකුණ කොට්ඨාශය — හම්බන්තොට දිස්ත්‍රික්කය

වැලිගත්ත-බුන්දල පාරේ අංක 4/6 දරන පාලම

ඉහත සඳහන් පාලම නැවත සෑදීමේ බලාපොරොත්තුවෙන්, එය සියළුම රථවාහන උදෙසා, තව දුරටත් නිවේදනය කරණ තෙක් වසා තබනු ලැබේ.

2. මේ හැරුණු විට වෙනත් මාර්ගයක් නැත.

වී. ඊ. හේරත්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ කාර්‍යශාලය,
කොළඹ, 1962. 5. 29.

6-309

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3. 30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි